සැ. යු. -2009.05.29 දින පළ වූ අංක 1,604 දරන *ගැසට් පත්‍රයේ* III සහ IV(අ) කොටස් පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,605 - 2009 ජූනි මස 05 වැනි සිකුරාදා - 2009.06.05**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : I වැනි ඡේදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 730 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 737 |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |
| රජයේ නිවේදන ... ... ... | 737 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 739 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා භාරගන්නා සියලුම දැන්වීම් *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2009 ජූනි මස 12 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2009 මැයි මස 29 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2009 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2009 අංක 169

DRF/21/RECT/2744.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක් සහ නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීමක්

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරි 2008 දෙසැම්බර් මස 09 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

මේජර් ජෙනරල් අසෝක බණ්ඩාර තෝරදෙනිය, යූඑස්පී (නි/50752)

**නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීමක්**

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරි 2008 දෙසැම්බර් මස 09 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීම අතිගරු ජනාධිපතිත උතුමාණන් විසින් අනුමත කර ඇත.

මේජර් ජෙනරල් අසෝක බණ්ඩාර තෝරදෙනිය යූඑස්පී (නි/50752)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2008 නොවැම්බර් මස 28 වැනි දින,
කොළඹ.

06-60

---

2009 අංක 170

DRF/RECT/1003/AY.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල උසස් කිරීමක්

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරි 2003 මැයි මස 17 වැනි දින සිට මේජර් ජෙනරල් නිලයට උසස් කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

බ්‍රිගේඩියර් මනමෙල්දූර රෝහණ වීර ද සොයිසා, යූඑස්පී පීඑස්සී (නි/50657)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2008 ඔක්තෝබර් මස 18 වැනි දින,
යුද්ධ හමුදා මූලස්ථානය,
කොළඹ.

06-56

---

2009 අංක 171

DRF/RECT/770(21).

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීම්, නිල උසස් කිරීම් හා නව තනතුරු පත් කිරීම

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරින්ගේ නිල ස්ථිර කිරීම, නිල උසස් කිරීම හා නව තනතුරු පත් කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

**නිල ස්ථිර කිරීම්**

(අ) 2003 ජූනි මස 06 වැනි දින සිට ලුතිතන් කර්නල් වශයෙන්

(1) මේජර් (තාවකාලික ලුතිතන් කර්නල්) වන්නිආරච්චිගේ අරුණ වන්නිආරච්චි, ආර්එස්පී පීඑස්සී ගැහේබ

(ආ) 2003 ජූනි මස 14 වැනි දින සිට ලුතිතන් කර්නල් වශයෙන් :

(1) මේජර් (තාවකාලික ලුතිතන් කර්නල්) දොලමුල්ලේ කන්කානම්ගේ ගාමිණී දේශප්‍රිය සිරිසේන, ශ්‍රීලයුපොහේබ

**නිල උසස් කිරීම**

(ඇ) 2008 ජනවාරි මස 29 වැනි දින සිට තාවකාලික කර්නල් වශයෙන් :

(1) ලුතිතන් කර්නල් ඩබ්ජ් වන්නිආරච්චි, ආර්එස්පී පීඑස්සී ගැහේබ

**තනතුරු පත් කිරීම**

(ඈ) 2008 ජනවාරි මස 29 වැනි දින සිට :

(1) ලුතිතන් කර්නල් (තාවකාලික කර්නල්) ඩබ්ජ් වන්නිආරච්චි, ආර්එස්පී පීඑස්සී යුද්ධ හමුදා මූලස්ථානයේ යුද සේවා

ලේකම් ශාඛාවේ කර්නල් යුදසේවා ලේකම් වශයෙන් පත් කිරීම

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2008 පෙබරවාරි මස 27 වැනි දින,
කොළඹ.

06-59/2

---

2009 අංක 172

DRF/RECT/580(V)AY.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද මරණින් පසු නිල උසස් කිරීමක්

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරිගේ මරණයෙන් පසු නිල උසස් කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර තිබේ :

(අ) කපිතන් රණවක ආරච්චිගේ කීර්ති රණවක, ශ්‍රීලසසබ (නි/64328)

(1) 2007 ජූලි මස 22 වැනි දින සිට මේජර් නිලයට උසස් කිරීම
(2) 2008 මාර්තු මස 10 වැනි දින සිට මරණයෙන් පසු ලුතිතන් කර්නල් නිලයට උසස් කිරීම

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2008 අප්‍රේල් මස 16 වැනි දින,
කොළඹ.

06-58/3

---

2009 අංක 173

DRF/21/RECT/2714.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීමක් නිල උසස් කිරීමක් සහ විශ්‍රාම ගැනීමක්

**නිල ස්ථිර කිරීමක්**

පහත නම සඳහන් නිලධාරි 2008 ජූනි මස 29 වැනි දින සිට මේජර් නිලයේ ස්ථිර කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

කපිතන් (තාවකාලික මේජර්) සමන් රෝහාන්ත ත්‍රිමාවිතාන, ගැහේබ (නි/60605)

**නිල උසස් කිරීමක්**

පහත නම සඳහන් නිලධාරි 2008 ජූනි මස 30 වැනි දින සිට ලුතිතන් කර්නල් නිලයට නිල උසස් කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

මේජර් සමන් රෝහාන්ත ත්‍රිමාවිතාන, ගැහේබ (නි/60605)

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරි 2008 ජූලි මස 01 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

ලුතිතන් කර්නල් සමන් රෝහාන්ත ත්‍රිමාවිතාන, ගැහේබ (නි/60605)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2008 ඔක්තෝබර් මස 22 වැනි දින,
කොළඹ දී ය.

06-16

---

2009 අංක 174

DRF/RECT/770(21).

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල උසස් කිරීම හා නව තනතුරු පත් කිරීම

1. පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරිගේ නිල උසස් කිරීම හා නව තනතුරු පත් කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

**නිල උසස් කිරීම**

(අ) 2008 මාර්තු මස 13 වැනි දින සිට තාවකාලික ලුතිතන් කර්නල් වශයෙන් මේජර් කේඑච්කේ කෝට්ටවත්ත, ගැහේබ

**තනතුරු පත් කිරීම**

(අ) 2008 මාර්තු මස 13 වැනි දින සිට මේජර් (තාවකාලික ලුතිතන් කර්නල්) කේඑච්කේ කෝට්ටවත්ත, ගැහේබ - 1 වැනි ගැමුණු හේවා බළඇණියේ අණදෙන නිලධාරි වශයෙන් පත් කිරීම.

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2008 මැයි මස 02 වැනි දින,
කොළඹ.

06-59/3

---

2009 අංක 175

DRF/RECT/770(21).

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

**අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීම්**

පහත නම් සඳහන් නිලධාරීන් ඔවුන්ගේ නම් ඉදිරියෙන් දක්වා ඇති දින සිට මේජර් නිලයේ ස්ථිර කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

1. නි/61038 කපිතන් (තාවකාලික මේජර්) චම්පක දසරත් රණසිංහ, ආර්ඩබ්පී ආර්එස්පී ගරෙ - 2001.06.10
2. නි/61090 කපිතන් (තාවකාලික මේජර්) භාතිය නිරාන් මලගල, ශ්‍රීලසබ - 2001.12.23
3. නි/61128 කපිතන් (තාවකාලික මේජර්) ධම්මි ගෝනදෙනිය හේවගේ, ආර්එස්පී ගරෙ - 2001.12.23
4. නි/63389 කපිතන් (තාවකාලික මේජර්) වන්නිනායක මුදියන්සේලාගේ උපතිස්ස හුලුගල්ල, ශ්‍රීලයුවෙබ - 2002.02.20
5. නි/61414 කපිතන් (තාවකාලික මේජර්) සම්පතා වඩුගේ මහේන්ද්‍ර ප්‍රනාන්දු ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී, ශ්‍රීලසබ - 2003.04.05
6. නි/61623 කපිතන් (තාවකාලික මේජර්) කපිල චානක ප්‍රතාපසිංහ, ශ්‍රීලංසංබ - 2003.05.12
7. නි/61503 කපිතන් (තාවකාලික මේජර්) දොන් නිලන්ත පුෂ්ප කුමාර ජයවීර, කරෙ - 2003.07.19
8. නි/61510 කපිතන් (තාවකාලික මේජර්) වගගේ නිමල් සෝමසිරි, ශ්‍රීලකාහ - 2003.07.19
9. නි/61536 කපිතන් (තාවකාලික මේජර්) මොහොමඩ් අබ්දුල් රසාන් හම්ඩොන් ගැහේබ - 2003.07.19
10. නි/61751 කපිතන් (තාවකාලික මේජර්) ධනංජය කුමාර අළුදෙනිය, විපාරෙ - 2004.07.30
11. නි/61996 කපිතන් (තාවකාලික මේජර්) හිල්මි ඉම්ටියාස් අහමට්, ශ්‍රීලපාහ - 2005.01.14
12. නි/62113 කපිතන් (තාවකාලික මේජර්) කොහොන අදිකාරම් වලව්වේ නලින් හර්ෂප්‍රිය බණ්ඩාරනායක, විපාරෙ - 2005.03.07
13. නි/62616 කපිතන් (තාවකාලික මේජර්) සුදත් නිශාන්ත කිතුල්ගොඩ, ඉසේබ - 2005.04.20
14. නි/62199 කපිතන් (තාවකාලික මේජර්) මුල්ලේරියාවගේ චන්ද්‍රික සමන් කුලතිලක සේනාරත්න, ආර්එස්පී ශ්‍රීලපාහ - 2005.05.14
15. නි/62175 කපිතන් (තාවකාලික මේජර්) දොන් බන්දුල ලයනාත් කොලොන්නේ, ශ්‍රීලංඉ - 2005.05.14
16. නි/62208 කපිතන් (තාවකාලික මේජර්) දොන් චින්තක අසේල වික්‍රමසිංහ, පීඑස්සී ශ්‍රීලංඉ - 2005.05.14
17. නි/61813 කපිතන් (තාවකාලික මේජර්) මදුරප්පෙරුම ආරච්චිගේ දීප්ති අල්විස් විජේගුණරත්න, ආර්එස්පී කරෙ - 2005.06.17
18. නි/61818 කපිතන් (තාවකාලික මේජර්) බුලත්ගම ඇතිරාලලාගේ සම්පත් ශ්‍රී ධම්මික බුලත්ගම, ගැහේබ - 2005.06.17
19. නි/62088 කපිතන් (තාවකාලික මේජර්) ඒකනායක මුදියන්සේලාගේ ගමගෙදර අශෝක අඹන්පොල, ශ්‍රීලයුසේබ - 2005.07.15
20. නි/63808 කපිතන් (තාවකාලික මේජර්) කුලන්දවෙල් සුසන්ත මොහාන් කුමාර්, ඉසේබ - 2005.10.23
21. නි/62776 කපිතන් (තාවකාලික මේජර්) හේවාගේ රංජිට් රොසයිරු, යූඑස්පී, ශ්‍රීලයුපොදුසේබ - 2005.11.06
22. නි/61945 කපිතන් (තාවකාලික මේජර්) සමරදිවාකර බස්නායක වාසල මුදියන්සේලාගේ නිශ්ශංක සමරදිවාකර, ශ්‍රීලංඉ - 2005.11.09
23. නි/61947 කපිතන් (තාවකාලික මේජර්) ලියන ආරච්චිගේ උදේනි උමේන්ද්‍ර වීරසිංහ, ශ්‍රීලයුපොහේබ - 2005.11.09
24. නි/61959 කපිතන් (තාවකාලික මේජර්) වෙනුර එරංජිත් වීරක්කොඩි, ශ්‍රීලයුපොදුසේබ - 2005.11.09
25. නි/61829 කපිතන් (තාවකාලික මේජර්) සමන් ඉන්ද්‍රජිත් ප්‍රියන්කර විදානගමගේ, ආර්එස්පී, ශ්‍රීලකාහ - 2006.03.10
26. නි/61944 කපිතන් (තාවකාලික මේජර්) දොන් විජිත මහේෂ් නන්දන හෙට්ටිආරච්චි, ආර්එස්පී කරෙ - 2006.03.10
27. නි/62343 කපිතන් (තාවකාලික මේජර්) අළුත්දුර හේවාගේ අරුණ දීප්ති ආරියසේන, ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී ගරෙ - 2006.03.10
28. නි/62345 කපිතන් (තාවකාලික මේජර්) රත්නපුලි වසන්ත කුමාර හේවගේ, ආර්එස්පී ශ්‍රීලංසිරෙ - 2006.03.10
29. නි/62346 කපිතන් (තාවකාලික මේජර්) ප්‍රතාප සායක්කාරගේ සුබාත් සංජීව, ආර්එස්පී විපාරෙ - 2006.03.10
30. නි/62350 කපිතන් (තාවකාලික මේජර්) දේහිංග ලසී උදාර ද තාබ්‍රේව්, ආර්ඩබ්පී, ආර්එස්පී, ශ්‍රීලපාහ - 2006.03.10
31. නි/62351 කපිතන් (තාවකාලික මේජර්) මැදගොඩ ජයසිංහලාගේ රොහාන් සුරේන්ද්‍ර මැදගොඩ, ආර්එස්පී ශ්‍රීලකාහ - 2006.03.10
32. නි/62353 කපිතන් (තාවකාලික මේජර්) මිහිඳුකුලසූරිය නිලංග ප්‍රනාන්දු, ආර්එස්පී ගරෙ - 2006.03.10
33. නි/62355 කපිතන් (තාවකාලික මේජර්) හබරගමුවගේ දොන් ලලිත් සුරේන්ද්‍ර පෙරේරා, ආර්එස්පී, කරෙ - 2006.03.10
34. නි/62348 කපිතන් (තාවකාලික මේජර්) හේරත් ඒකනායක මුදියන්සේලාගේ ඉඩම වලව්වේ සෙනෙවිරත්න සම්පත් ඒකනායක, ගැහේබ - 2006.03.10
35. නි/62363 කපිතන් (තාවකාලික මේජර්) විජේකෝන් මුදියන්සේලාගේ සුමේධ නාලක විජේකෝන්, ශ්‍රීලයුයුබ - 2006.03.10
36. නි/62369 කපිතන් (තාවකාලික මේජර්) හොරණ පතිරනගේ ඉන්දික පෙරේරා, ආර්ඩබ්පී ආර්එස්පී ගරෙ - 2006.03.10
37. නි/62374 කපිතන් (තාවකාලික මේජර්) විසින් මුදියන්සේලාගේ සුජීව තිරෝෂාන් ඇරැගොඩ, ආර්ඩබ්පී ආර්එස්පී ගරෙ - 2006.03.10
38. නි/62536 කපිතන් (තාවකාලික මේජර්) මුතුකුඩ විජේසූරිය ආරච්චිගේ රුවන් චමින්ද විජේසූරිය, ශ්‍රීලසබ - 2006.05.22

39. නි/62493 කපිතන් (තාවකාලික මේජර්) පාටක රාලලාගේ බන්දුල අබයරත්න බණ්ඩාර, ආර්එස්පී ශ්‍රීලපාහ - 2006.05.22
40. නි/62517 කපිතන් (තාවකාලික මේජර්) ලක්රුවන් චමින්ද කරාගොඩ පතිරණ, ආර්එස්පී ශ්‍රීලකාහ - 2006.05.22
41. නි/62509 කපිතන් (තාවකාලික මේජර්) කුලසේකර මුදියන්සේලාගේ නදීක කුලසේකර, ආර්එස්පී පීඑස්සී ගැහේබ - 2006.05.22
42. නි/62524 කපිතන් (තාවකාලික මේජර්) මඩකලපුගේ ලක්ෂාන් අනුරුද්ධික ද සිල්වා, ගරෙ - 2006.05.22
43. නි/62510 කපිතන් (තාවකාලික මේජර්) තුවාන් නසීර් මජීඩ්, සබුබ - 2006.05.22
44. නි/62496 කපිතන් (තාවකාලික මේජර්) තුසේකුරෙ මොහොට්ටි ගුරුන්නාන්සේලාගේ සුරේෂ් තුෂාර කුරේ, ආර්එස්පී කරෙ - 2006.05.22
45. නි/62535 කපිතන් (තාවකාලික මේජර්) පියල් නිශාන්ත විජේසිරිවර්ධන, ආර්එස්පී, ශ්‍රීලසසබ - 2006.05.22
46. නි/62530 කපිතන් (තාවකාලික මේජර්) ප්‍රියංකර විතානගේ, ශ්‍රීලවියාඉ - 2006.05.22
47. නි/62531 කපිතන් (තාවකාලික මේජර්) වනසේකර ආරච්චිලාගේ උෂාන්ත සංජීව වනසේකර, ආර්ඩබ්ලිව්පී ගරෙ - 2006.05.22
48. නි/62514 කපිතන් (තාවකාලික මේජර්) කාංචන නන්දිමාල් ඉදිකැටිහේවගේ, ඉසේබ - 2006.05.22
49. නි/62494 කපිතන් (තාවකාලික මේජර්) ගලඋඩ බණ්ඩාර වාසල මුදියන්සේ රාලහාමිල්ලාගේ කාංචන රාජගුරු බංඩාර, ගැහේබ - 2006.05.22
50. නි/61992 කපිතන් (තාවකාලික මේජර්) තල්හිටිය දොන් ලක්ෂි තුෂාර රේමන්ඩ්, ශ්‍රීලයුසේබ - 2006.06.01
51. නි/61320 කපිතන් (තාවකාලික මේජර්) (උපකරණ පාලක) මතුමගේ සරත් ධර්මසිරි පෙරේරා, යූඑස්පී ශ්‍රීලංසිරෙ - 2005.08.31
52. නි/61920 කපිතන් (තාවකාලික මේජර්) (උපකරණ පාලක) රාජකරුණා දේවයලාගේ ජයරත්න, යූඑස්පී ශ්‍රීලයුවෙබ - 2005.08.31
53. නි/61925 කපිතන් (තාවකාලික මේජර්) (උපකරණ පාලක) කුමාර උන්නැහැලාගේ ලාල් ඩයස්, ශ්‍රීලයුවෙබ - 2005.08.31
54. නි/61930 කපිතන් (තාවකාලික මේජර්) (උපකරණ පාලක) ධර්මසේන විජේතුංග, ශ්‍රීලයුවෙබ - 2005.08.31
55. නි/62378 කපිතන් (තාවකාලික මේජර්) (උපකරණ පාලක) තෙන්නකෝන් මුදියන්සේලාගේ ධර්මවර්ධන බණ්ඩා, යූඑස්පී ඉසේබ - 2005.08.31
56. නි/62390 කපිතන් (තාවකාලික මේජර්) (උපකරණ පාලක) වර්ණකුලසූරිය බර්නට් නොයෙල් ලක්ෂමන් ප්‍රනාන්දු, ශ්‍රීලයුපොදුසේබ - 2005.08.31
57. නි/62402 කපිතන් (තාවකාලික මේජර්) (උපකරණ පාලක) දේවාලෙගම් ආචාරිගේ කෝලිත, යූඑස්පී, ශ්‍රීලයුවෙබ - 2005.08.31

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2008 ජුනි මස 20 වැනි දින,
කොළඹ දී ය.

06-59/1

---

2009 අංක 176

DRF/RECT/580(V)AY.

## ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව

### අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද මරණින් පසු නිල උසස් කිරීමක්

පහත නම සඳහන් නිලධාරීගේ මරණයෙන් පසු නිල උසස් කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර තිබේ.

(අ) කපිතන් රණසිංහ ආරච්චිලාගේ තිලින චාමින්ද රණසිංහ, ගරෙ (නි/65480) - 2007 ජනවාරි මස 07 දින සිට මරණයෙන් පසු මේජර් නිලයට උසස් කිරීම

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 මාර්තු මස 20 වැනි දින,
කොළඹ.

06-58/1

---

2009 අංක 177

DRF/RECT/580(V)AY.

## ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව

### අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද මරණින් පසු නිල උසස් කිරීම්

1. පහත නම් සඳහන් නිලධාරීන්ගේ මරණයෙන් පසු නිල උසස් කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර තිබේ.

(අ) කපිතන් අගම්පොඩි ප්‍රදීප් දර්ශණ ද සොයිසා වික්‍රමරත්න, ගැහේබ (නි/65236) - 2008 පෙබරවාරි මස 24 දින සිට මරණයෙන් පසු මේජර් නිලයට උසස් කිරීම
(ආ) කපිතන් ඉන්දික සුදර්ශන් මානවඩු, ශ්‍රීලංසිරෙ (නි/64793) - 2008 පෙබරවාරි මස 29 වැනි දින සිට මරණයෙන් පසු මේජර් නිලයට උසස් කිරීම
(ඇ) කපිතන් කටුපැලැල්ල මුදියන්සේලාගේ උදේනි සමන් කුමාර උඩුගම, ගැහේබ (නි/65326) - 2008 මාර්තු මස 10 වැනි දින සිට මරණයෙන් පසු මේජර් නිළයට උසස් කිරීම

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2008 අප්‍රේල් මස 16 වැනි දින,
කොළඹ දී ය.

06-58/2

2009 අංක 178

DRF/RECT/250(XX)AY.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිළ උසස් කිරීම්

පහත නම සඳහන් නිලධාරීන් ඔවුන්ගේ නමට ඉදිරියෙන් දක්වා ඇති දිනවල සිට තාවකාලික මේජර් නිලයට උසස් කිරීම අනුමත කර තිබේ.

1. නි/61391 කපිතන් බටලීය පතිරන්නැහැලාගේ අජිත් පුෂ්පලාල් තිලකරත්න, කරෙ - 2000 ඔක්තෝබර් මස 01
2. නි/62371 කපිතන් දොන් තිලක් ලක්ෂ්මන් සුසන්ත කරවිටගේ, ශ්‍රීලපාහ - 2004 ජූනි 01
3. නි/62314 කපිතන් ශමින්ද රත්සර විජේතුංග ආර්එස්පී ගරෙ - 2006 ජූනි 01
4. නි/62689 කපිතන් කැළුම් තුෂාර ගෝනදුවගේ, ගැහේබ - 2003 ජූලි 18
5. නි/62570 කපිතන් එගොඩවත්ත ආරච්චිගේ දොන් කැළුම් සූරිය කුමාර, කරෙ - 2006 ජූනි 01
6. නි/64079 කපිතන් තෙන්නකෝන් මුදියන්සේලාගේ කමල් චන්දන අමරකෝන්, ගැහේබ - 2006 ජූලි 11
7. නි/63293 කපිතන් ගල්හේන අප්පුහාමිලාගේ දොන් ඉන්දික සංජීව සමරනායක, ආර්එස්පී ගැහේබ - 2006 සැප්තැම්බර් 11
8. නි/63408 කපිතන් අබේරත්න මුදියන්සේලාගේ කමල් උපුල් බංඩාර රත්නායක, ගරෙ - 2006 නොවැම්බර් 09
9. නි/63455 කපිතන් මැද අලවතුකොටුවේ ගෙදර ප්‍රියන්ත බංඩාර, ගැහේබ - 2007 ජනවාරි 06
10. නි/64198 කපිතන් හේවා කළුහල මුල්ලගේ ගයනාත් අසේල, ශ්‍රීලංඉ - 2007 ජනවාරි 15
11. නි/64271 කපිතන් චමින්ද ප්‍රියලාල් සුදසිංහ, ශ්‍රීලකාහ - 2007 ජනවාරි 15

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2008 පෙබරවාරි මස 05 වැනි දින,
කොළඹ දී ය.

06-57/2

---

2009 අංක 179

**ජාතික ශිෂ්‍යභට බලකාය**

අතිගරු ජනාධිපති උතුමණන් විසින් අනුමත කරන ලද නිල උසස් කිරීම

2007 මාර්තු මස 01 වැනි දින සිට තාවකාලික මේජර් වශයෙන්

නි/4123 කපිතන් එල් යූ ඩබ්ලිව් ජයලත්

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2009 මැයි මස 18 වැනි දින,
කොළඹ දී ය.

06-11

---

2009 අංක 180

DRF/RECT/250(XX)AY.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල උසස් කිරීම්

පහත නම සඳහන් නිලධාරීන් 2008 ජනවාරි මස 04 වැනි දින සිට තාවකාලික මේජර් නිලයට උසස් කිරීම අනුමත කර තිබේ ඃ

1. නි/64457 කපිතන් දොන් පාවුලු ආරච්චිලාගේ සුරංග අනුරාධ විතාරණ, ශ්‍රීලසසබ
2. නි/64460 කපිතන් ලියනගෙදර අජන්ත කුමාර තිලකරත්න, සබුබ
3. නි/64464 කපිතන් දේශප්‍රිය ප්‍රභාත් චන්ද්‍ර වීරසිංහ සිල්වා, ශ්‍රීලංසිරෙ
4. නි/64466 කපිතන් උඩදිවෙලේ ගෙදර අස්සැද්දුම කිරලලාගේ නලින් ඉන්දික සෝමපාල, කරෙ
5. නි/64468 කපිතන් සමරකෝන් මුදියන්සේලාගේ ධම්මික නයනානන්ද සමරකෝන්, ශ්‍රීලපාහ
6. නි/64470 කපිතන් සුසන්ත අරුනප්‍රිය දොඩම්පෙ ගමගෙදර, ශ්‍රීලංසංබ
7. නි/64477 කපිතන් ලියනාරච්චි අප්පුහාමිලාගේ නාලක ලියනාරච්චි, ගරෙ
8. නි/64486 කපිතන් කැකුලාවල ජයවර්ධන ආරච්චිලාගේ චාමික ප්‍රභාත් ජයවර්ධන, ශ්‍රීලකාහ
9. නි/64487 කපිතන් බටුවන්තුඩාව කංකානම්ගේ තුෂාර නාමල් බටුවන්තුඩාව, ශ්‍රීලංඉ
10. නි/64490 කපිතන් ලන්සක්කාර රත්නායක මුදියන්සේලාගේ උපුල බණ්ඩාර රත්නායක, ශ්‍රීලකාහ
11. නි/64492 කපිතන් අමරසේකර ලියන ආරච්චිගේ නුවන් ධම්මික, ගැහේබ
12. නි/64497 කපිතන් රත්නායක මුදියන්සේලාගේ රවින්ද්‍ර සමන් රත්නායක, කරෙ
13. නි/64499 කපිතන් හෙට්ටිආරච්චිලාගේ ධම්මික වසන්ත හෙට්ටිආරච්චි, ශ්‍රීලංසංබ

14. නි/64503 කපිතන් රත්නායක මුදියන්සේලාගේ අනුර කුමාර රත්නායක, ඉසේබ
15. නි/64504 කපිතන් චමින්ද සම්පත් සේරසිංහ, ශ්‍රීලංසිරෙ
16. නි/64511 කපිතන් කළුතන්ත්‍රිගේ ගුණක මොහාන් පීරිස් ගුණතිලක, ශ්‍රීලකාහ
17. නි/61514 කපිතන් පුංචිබණ්ඩා දිසානායකගේ චමින්ද දිසානායක, ගැහේබ
18. නි/64516 කපිතන් ඉඹුලාන කුරුවිට ආරච්චිගේ චන්දිම කුමාර, ශ්‍රීලපාහ
19. නි/64518 කපිතන් වික්‍රමාරච්චිගේ දොන් සුරංග දිෂාන්ත වික්‍රමාරච්චි, ශ්‍රීලසසබ
20. නි/64520 කපිතන් දොඩම්පහල හේවගේ සුසන්ත මංජුල චන්ද්‍රලාල් ආර්එස්පී ශ්‍රීලපාහ
21. නි/64521 කපිතන් රොෂාන් සංජය පෙරේරා, ශ්‍රීලයුයුබ
22. නි/64522 කපිතන් රත්නායක මුදියන්සේලාගේ බන්දුල රත්නායක, ශ්‍රීලසසබ

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2008 පෙබරවාරි මස 27 වැනි දින,
කොළඹ දී ය.

06-57/1

---

2009 අංක 181

DRF/21/RECT/2737.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බළ හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද අධිකාරියෙන් ඉල්ලා අස්වීමක්

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවේ පහත නම සඳහන් නිලධාරි 2008 සැප්තැම්බර් මස 15 වැනි දින සිට අධිකාරියෙන් ඉල්ලා අස්වීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

ලුතිතන් සොමිරුවන් හේවා කන්ඩම්බි ගරෙ (නි/65448)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2008 ඔක්තෝබර් මස 29 වැනි දින,
කොළඹ දී ය.

06-17

DRF/21/RECT/2738.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද අපකීර්ති සහගත ලෙස සේවයෙන් ඉවත් කිරීමක්

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවේ පහත නම සඳහන් නිලධාරි 2008 මැයි මස 12 වැනි දින සිට අපකීර්ති සහගත ලෙස සේවයෙන් ඉවත් කරනු ලැබීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

දෙවන ලුතිතන් දොන් ජයන්ත කොඩිතුවක්කු, ගැහේබ (නි/66090)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2008 දෙසැම්බර් මස 05 වැනි දින,
යුද්ධ හමුදා මූලස්ථානය,
කොළඹ දී ය.

06-55

---

2009 අංක 182

DRF/RECT/30AY.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්වේච්ඡා බළසේනාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීමක්, නිල උසස් කිරීමක් සහ පත් කිරීමක්

**නිල ස්ථිර කිරීම**

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරි 2007 නොවැම්බර් මස 19 වැනි දින සිට බ්‍රිගේඩියර් නිලයෙහි ස්ථිර කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

කර්නල් (තාවකාලික බ්‍රිගේඩියර්) අමිත චන්ද්‍රසිරි ඔබේසේකර (නි/2143)

**නිල උසස් කිරීම**

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරි 2007 නොවැම්බර් මස 20 වැනි දින සිට මේජර් ජෙනරල් නිලයට උසස් කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

බ්‍රිගේඩියර් අමිත චන්ද්‍රසිරි ඔබේසේකර (නි/2143)

**පත් කිරීම**

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරි 2007 නොවැම්බර් මස 20 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ නියෝජ්‍ය සේනාවිධායක තනතුරට පත් කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

මේජර් ජෙනරල් අමිත චන්ද්‍රසිරි ඔබේසේකර (නි/2143)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2008 ජනවාරි මස 10 වැනි දින,
කොළඹ දී ය.

06-13

---

2009 අංක 183

DRF/RECT/1053/AY.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්වේච්ඡා බල සේනාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීමක් සහ විශ්‍රාම ගැන්වීමක්

**නිල ස්ථිර කිරීම**

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරි 2009 ජනවාරි මස 19 වැනි දින සිට බ්‍රිගේඩියර් නිලයේ ස්ථිර කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

බ්‍රෙවේ බ්‍රිගේඩියර් සියඹලාපිටියගේ දොන් අජන්ත රෝහණ චන්ද්‍රසිංහ (නි/2078)

**විශ්‍රාම ගැන්වීම**

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරි 2009 ජනවාරි මස 20 වැනි දින සිට ශ්‍රී ලංකා යුද හමුදා ස්වේච්ඡා බලසේනාවෙන් විශ්‍රාම ගැන්වීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

බ්‍රිගේඩියර් සියඹලාපිටියගේ දොන් අජන්ත රෝහණ චන්ද්‍රසිංහ (නි/2078)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2009 මාර්තු මස 04 වැනි දින,
කොළඹ දී ය.

06-18/2

2009 අංක 184

DRF/RECT/1053/AY.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්වේච්ඡා බළ සේනාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල උසස් කිරීමක්

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරි 2007 අගෝස්තු මස 01 වැනි දින සිට බ්‍රෙවේ බ්‍රිගේඩියර් නිලයට උසස් කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

කර්නල් සියඹලාපිටියගේ දොන් අජන්ත රෝහණ චන්ද්‍රසිංහ (නි/2078)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 ඔක්තෝබර් මස 08 වැනි දින,
කොළඹ දී ය.

06-18/1

---

2009 අංක 185

DVF/RECT/162(ii)

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්වේච්ඡා බලසේනාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැන්වීමක්

පහත නම සඳහන් නිලධාරි 2008 දෙසැම්බර් මස 01 වැනි සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

මේජර් දැඩිගමුවගේ රත්නසිරි පීරිස්, ශ්‍රීලයුසේබ (නි/2920)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2008 ඔක්තෝබර් මස 29 වැනි දින,
කොළඹ දී ය.

06-14

DVF/RECT/22(Vii)AY

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්වේච්ඡා බලසේනාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද අධිකාරියෙන් ඉවත් කිරීමක්

පහත නම සඳහන් නිලධාරී 2007 නොවැම්බර් මස 30 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ අධිකාරියෙන් ඉවත් කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

ලුතිතන් කනක්කගේ සුමීර ලලන්ත සිල්වා, ශ්‍රීලයුසේබ (නි/3295)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 දෙසැම්බර් මස 18 වැනි දින,
කොළඹ දී ය.

06-12

2009 අංක 186

DVF/RECT/260.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්වේච්ඡා බලසේනාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

පහත නම සඳහන් නිලධාරී 2008 නොවැම්බර් මස 01 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

ලුතිතන් (උපකරණ පාලක) (පොදු රාජකාරී) එදිරිමුණි සුදිගු රම්‍ය සුනිල් ද සිල්වා, ගරෙ (නි/5992)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2008 දෙසැම්බර් මස 19 වැනි දින,
කොළඹ දී ය.

06-15

# අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය

2009 අංක 187

අමාත්‍ය මණ්ඩලය විසින් පහත සඳහන් පත්වීම කර ඇත.

එස්. එම්. ඩබ්ලිව්. ප්‍රනාන්දු මහතා 2009 පෙබරවාරි මස 03 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරනතුරු සර්වේයර් ජනරාල් වශයෙන්.

06-07

# රජයේ නිවේදන

**ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය**

2002 අංක 17 දරන මැනුම් පනත

**27 වැනි වගන්තියේ විධිවිධාන යටතේ ඉඩම් මැනුම් සභාවේ සාමාජිකයින් පත් කිරීම**

2002 අංක 17 දරන මැනුම් පනතේ 27 (ආ)(i) හා (ii) වගන්ති යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා වශයෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, පහත සඳහන් තැනැත්තන් ඉඩම් මැනුම් සභාවේ සාමාජිකයින් ලෙස, 2009.01.01 දින සිට බලපැවැත්වෙන පරිදි අවුරුදු තුනක ධුර කාලයක් සඳහා පත් කරමි.

*(අ) මැනුම් පනතේ 27(ආ)(ඇ)(i) වගන්තිය යටතේ පත්කළ සාමාජිකයින්* :-

(i) ජෙරල්ඩ් ඇන්තනී ද සිල්වා
(ii) කුලතුංග විජේකෝන් මුදියාන්සෙලාගේ වික්ටර් මාපිටිගම
(iii) තන්තිරිගේ දොන් විමල් ප්‍රේමසිරි පෙරේරා

*(ආ) මැනුම් පනතේ 27(ආ) (ii) වගන්තිය යටතේ පත්කළ සාමාජිකයින්* :-

(i) ජයකොඩි ආරච්චිලාගේ ස්වර්ණලතා ජයකොඩි

ජීවන් කුමාරණතුංග,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

වර්ෂ 2009ක් වූ මැයි මස 19 වැනි දින,
කොළඹ දී ය.

06-79

**1941 අංක 39 දරන ණය සහනදායක ආඥාපනත**

අංක 25/26 වැනි වගන්තිය යටතේ දැනුම් දීම

වර්ෂ 1941 අංක 40 දරන ආඥාපනත, 1959 අංක 5 දරන ආඥාපනත, 1964 අංක 24 දරන පනත, 1973 අංක 41 දරන පනත, 1978 අංක 19 දරන පනත ආදී සංශෝධන පනත්වලින් සංශෝධිත, 1941 අංක 39 දරන ණය සහනදායක ආඥාපනත යටතේ පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් ඉල්ලුම්පත් අංකයක් ඉදිරියේ දක්වා ඇති ණයකරු-ණයහිමි යන දෙපක්ෂය අතරේ බේරුමක් ඇති කිරීමට ප්‍රයත්නයක් දැරීමට ණය සහනදායක මණ්ඩලය අදහස් කර තිබේ.

02. මේ සම්බන්ධයෙන් මෙහි පහත සඳහන් ණයකරුවන්ගෙන් තමන්ට අයවිය යුතු ණයතුරුස් පිළිබඳ විස්තර ප්‍රකාශයක් තම තමන්ට පැමිණීමට දන්වා ඇති දිනට පෙර මෙම මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලෙස අදාල ණය හිමියන් වෙත ආඥාපනතේ 25(1), 26(1) වගන්ති යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

එන්. ඩබ්. ගුණදාස,
ලේකම්,
ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව.

2009 මැයි මස 15 වැනි දින,
අංක 428/11,
වීර ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල,
ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුවේ දී ය.

**උපලේඛනය**

| *ඉල්ලුම් පත් අංකය* | *ණයකරුගේ නම සහ ලිපිනය* | *ණයහිමිගේ නම සහ ලිපිනය* |
|---|---|---|
| (01) 41140 | රාමසාමි කමලම් මිය, අංක 20/4, ජයතිලක මාවත, හාලිඇල. | නීටා පුෂ්පජනි දිසානායක මිය, අංක 54, කයිලගොඩ, බදුල්ල. |
| (02) 41168 | වල්ගම්පලගේ සෝමසිරි පෙරේරා මයා, අංක 173/15, නව නිග්‍රෝධාරාම පාර, කළුතර උතුර. | මුණිවරගේ ලලිතා නන්දනී සිල්වා මිය, අංක 92, බෝසිරි පුර, කළුතර උතුර. |
| (03) 41184 | කඩදර කපුරාලලාගේ සුමනසේන මයා, අංක 124, බෝගස් හන්දිය, අතරගල්ලෑව. | පෝරුවල විතානගේ සෙනෙවිරත්න මයා, අංක 59, නූරි පාර, දැරණියගල |
| (04) 41196 | හදරාගමගේ දොන් චන්ද්‍රවංශ මයා, අංක 827/ඒ, මොරවිටිය පටුමඟ, ගොකටුව නව නගරය | මගගේ රනිල් ප්‍රනාන්දු මයා, අංක 28/9, වටරප්පල පාර, ගල්කිස්ස. |
| (05) 41209 | හේවාබජ්ජමගේ සුනිල් ශාන්ත මයා, අංක 2/16, කලල්ගොඩ, පන්නිපිටිය (මාළඹේ පාර) | පෝරගේ පුබුදු උපේන්ද්‍ර පෙරේරා මයා, අංක 215/ඒ/1/9, ඇන්ඩර්සන් මහල් නිවාසය, කොළඹ 05. |
| (06) 41212 | ගල්හේනේ කන්දගේ දොන් සුහදසිරි පුෂ්ප කුමාර මයා, තුසිත, හෙලඋඩ, ලත්පඳුර, බදුරලිය. | සීමාසහිත ජගත් ඉන්වෙස්ට්මන්ට් පුද්ගලික සමාගම, ඕවිටිගල, මතුගම |
| (07) 41214 | ලයනල් ධර්මකීර්ති නිශ්ශංක මයා, කොහිලේගෙදර, කොහිලේගෙදර. | යෝදින්ගේ කරුණාසිංහ මයා, තැන්නේගෙදර, ඇලිවලතැන්න, කොහිලේගෙදර. |
| (08) 41232 | කහඳවිට ගමගේ දොන් සිසිලි එලිසබෙත් මිය, අංක 96/2, පල්ලිය පාර, වත්තල. | සබරගමුව රාලලාගේ ෂෙල්ටන් පීරිස් මයා, අංක 333, කැළණිතිස්ස මාවත, වනවාසල, වත්තල |

| ඉල්ලුම් පත් අංකය | ණයකරුගේ නම සහ ලිපිනය | ණයහිමිගේ නම සහ ලිපිනය |
|---|---|---|
| (09) 41234 | හොරණගේ දුමින්ද ජයලත් ප්‍රනාන්දු මයා අංක 30/1, ගනේලන්ද, උග්ගල්ල, පාදුක්ක. | බෝපේ ගමගේ නාලින්ද කුමාර මයා, බෝපේ, පාදුක්ක. |
| (10) 41236 | වාහලතන්ත්‍රිගේ සෝමසිරි වෙනුවෙන් ඇටර්නි බලකරු, අංගම්පිටිය පතිරන්නැහැලාගේ ඉන්ද්‍රාවතී මිය, මල්වත්ත පාර කෙහෙල්වතුගොඩ, දේවාලේගම. | සිංගාර මුදියන්සේලාගේ දයාරත්න මයා, මල්වත්ත පාර, කෙහෙල්වතුගොඩ, දේවාලේගම. |

06-105

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ දැන්වීම

2009.05.05 වැනි දින පවත්වන ලද රැස්වීමකදී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. ප්‍රසිද්ධ නොතාරිස් එල්. එස්. ආතාවුද මහතා විසින් සහතික කරන ලද 2006 දෙසැම්බර් මස 22 වැනි දිනැති අංක 5482 දරන උකස්කරය මත මුල් මුදල් හා 2009.01.20 වැනි දින තෙක් පොළිය වශයෙන් රුපියල් තිස්තුන් ලක්ෂ හැට හතර දහස් හයසිය අනූ දෙකයි ශත දහඅටක (රු. 33,64,692.18) මුදල සමග රුපියල් තිස්එක් ලක්ෂ හැටනව දහසක (රු. 31,69,000) මුදල මත 2009.01.21 වැනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් සියයට විසිතුනක (23%) වාර්ෂික පොළියක් ද, මහනුවර, අස්ගිරිය, ශ්‍රී ධර්මපාල මාවතේ, අංක 63/1 දරන ස්ථානයේ පදිංචි මහින්ද පතිරන මයා හා මයිලපිටිය, "ශ්‍රී රත්න නිවස" හි පදිංචි අරවේ රත්නායක මුදියන්සේලාගේ කරුණාරත්න බණ්ඩාර රත්නායක මයා යන අයවළුන්ගෙන් ලංකා බැංකුවට එක්ව හා වෙන් වෙන්ව අයවිය යුතුව ඇත.

2. ඉහත කී ප්‍රසිද්ධ නොතාරිස් එල්. එස්. ආතාවුද මහතා විසින් සහතික කරන ලද 2006.12.22 දිනැති අංක 5482 දරන උකස්කරය මත අයවිය යුතු රුපියල් තිස්තුන් ලක්ෂ හැට හතර දහස් හයසිය අනූ දෙකයි ශත දහඅටක (රු. 33,64,692.18) මුදල සමග 2009.01.21 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොළිය ද, ලංකා බැංකු ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල්ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට මහනුවර, ටොරිංටන් පාර අංක 24හි පදිංචි වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන්ට එකී ලංකා බැංකු ආඥාපනතේ (396 අධිකාරය) 19 වැනි වගන්තිය හා එහි සංශෝධනයන් යටතේ ද, මෙම යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම මහනුවර ලංකා බැංකු අධිශ්‍රේණි ශාඛාවේ කළමනාකරු විසින් ප්‍රසිද්ධ කිරීමට එකී ලංකා බැංකු ආඥාපනතේ 21 වැනි වගන්තිය යටතේ ද මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

#### උපලේඛනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පාතහේවාහැට, හේවාවිස්ස කෝරළේ, පල්ලේ මාඹය හි පිහිටි බලයලත් මිනින්දෝරු කේ. එම්. එච්. නවරත්න මයා විසින් සාදන ලද 1985 සැප්තැම්බර් මස 24 දිනැති අංක 8100 දරන පිඹුරේ කැබලි "ඒ" යනුවෙන් පෙන්නුම් කර ඇති "කුඹුකේවෙල වත්ත" යයි හඳුන්වනු ලබන ඉඩමේ කොටසක් වන එකී පිඹුර අනුව, වයඹ දෙසට : මහනුවර දිසා අධිකරණයේ අංක 46688 දරන නඩු වාර්තාවේ ගොනුකර ඇති අංක 1106 දරන පිඹුරේ කැබලි 9 ද, ඊශාන දෙසට : කුඹුකේවෙල රජයේ ඉඩම ද, ගිණිකොණදෙසට : ටී. බී. කපුලියද්දට අයත් ටීපී 281362 මගින් හිමිකම් කියන ලද කුඹුකේවෙල හා වතු පාර ද, බස්නාහිරට : වතු පාර ද මායිම් වූ අක්කර පහළොවයි රූඩ් තුනයි පර්චස් අටක (අ. 15, රූ. 3, පර්. 8) වපසරියෙන් යුත් ඉහත කී ඉඩමේ හවුල් අයිතිකරුවන් සමග එකී පිඹුරේ කැබලි "සී" යනුවෙන් පෙන්නුම් කර ඇති පාර භාවිතා කිරීමේ අයිතිය ඇතුව, බෙදා වෙන් කරන ලද සියළු ඉඩම් කොටස, එහි තුළ ඇති වගාවන් හා සෑම සියළු දේත් වේ. මෙය මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී 296/207 පිටුවේ ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඊ. එම්. උපතිස්ස බණ්ඩාර මයා,
ප්‍රධාන කළමනාකරු.

ලංකා බැංකුව,
අධිශ්‍රේණි ශාඛාව,
මහනුවර

06-110

---

## ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ දැන්වීම

2009.03.26 වැනි දින පවත්වන ලද රැස්වීමකදී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. මහජන නොතාරිස් එම්. සී. ජයරාණී පීරිස් මහත්මිය විසින් සහතික කරන ලද 2003 සැප්තැම්බර් මස 16 වැනි දිනැති අංක 11599

සහ 2005 අගෝස්තු මස 18 වැනි දිනැති අංක 13408 දරන බැඳුම්කර මත මුල් මුදල හා 2009 මාර්තු මස 09 වැනි දින තෙක් පොලිය වශයෙන් රුපියල් හත්ලක්ෂ විසිඑක් දහස් පන්සියයි ශත පනස්අටක (රු. 7,21,500.58) මුදලක් සමඟ රුපියල් හාරලක්ෂ තිස්නවදහස් හයසිය හැත්තෑවයි ශත පනස් හතක (රු. 4,39,670.57) මුදලක් මත වසරකට සියයට විසිපහ (25%) බැගින් පොලියක් ද, 2009.03.10 වැනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් ලුනුවත්ත, කහටගහවත්ත, ධනුෂ්ක හි පදිංචි කුරුකුලසූරියගේ චාර්ලිස් පෙරේරා මහතාගෙන් අයවිය යුතුව ඇත

2. එකී අංක 11599 සහ 13408 දරන බැඳුම්කර මත අයවිය යුතු එකී රුපියල් හත්ලක්ෂ විසිඑක් දහස් පන්සියයි ශත පනස්අටක (රු. 7,21,500.58) මුදල සමග 2009.03.10 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොලිය ද, ලංකා බැංකු ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල්ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට බදුල්ල, කලුගල්පිටිය, අංක 48හි පදිංචි වෙන්දේසිකාර ඩබ්. ජයතිලක මහතාට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වැනි වගන්තිය යටතේ ද, ලංකා බැංකු ආඥාපනතේ 21 වැනි වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පළ කිරීමට ලංකා බැංකුව, ලුනුවත්ත ශාඛාවේ ශාඛා කළමනාකරුට ද මෙයින් අවසරදී බලය පවරනු ලැබේ.

### උපලේඛනය

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, උඩුකිඳ මහපළාත කෝරළේ, ඇත්කඳවකගම පිහිටි පොඩගොල්ලපතන 'නොහොත් ලුනුවත්තේ පතන ලෙස ප්‍රසිද්ධ සහ එනමැති ඉඩම් කැබැල්ල වන සර්වේයර් ජනරාල් ඒ. එච්. ජී. ඩුව්සන් විසින් සාදන ලද 1926.03.06 දිනැති අංක 374612 දරන මැනුම් පිඹුරෙහි නිරූපිත එකී කොටස එකී පිඹුරට අනුව උතුරට සහ බස්නාහිරට : රජයේ ඉඩමක් යැයි කියන පොඩගොල්ලපතන ද, නැගෙනහිරට : ටී. පී. 366191 හි ඉඩම සහ අප්පුහාමි ආරච්චිට අයත් මහකුඹුරේ තැන්නෙ වත්ත නමැති ඉඩම සහ ආර්. වේඩන්ගන් කංගානිට අයිති මහකුඹුරේ තැන්නෙ වත්ත නමැති ඉඩම ද, දකුණට : ආර්. වේඩන්ගන් කාංගානිට අයිති මහකුඹුරේ තැන්නෙ වත්ත නමැති ඉඩම ද මායිම් ව මේ සීමාවන් තුළ අක්කර දෙකයි පර්චස් විසිඅටක (අ. 2, රූ. 0, පර්. 28) වපසරියකින් යුක්තව එහි ඇති අනෙකුත් සියළු දේද වේ. මෙය බදුල්ල දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයෙහි සී 468/162 දරන පත්‍රිරුවෙහි ලියාපදිංචි කර ඇත.

පෙර කී ඇත්කඳවකගම පිහිටි ලුනුවත්තෙ පතන නොහොත් පොඩගොල්ලෙ පතන නමැති විස්තර කරන ලද බෙදූ ඉඩම් කැබැල්ල වන බලයලත් මිනින්දෝරු එච්. එම්. සමරනායක විසින් සාදන ලද 1999.08.05 දිනැති අංක 2025 දරන මැනුම් පිඹුරෙහි ලොට් අංක 2 ලෙස නිරූපිත එකී ඉඩම් කොටස එකී පිඹුරට අනුව උතුරට : ලොට් අංක 1 සහ ආර්. එම්. සුදුබණ්ඩා සහ චිත්‍රා සිරිවර්ධන උරුමකම් කියන ඉඩම් ද, නැගෙනහිරට : චිත්‍රා සිරිවර්ධන සහ වෙනත් අය උරුමකම් කියන ඉඩම ද, දකුණට : පී. ඒ. උක්කුබණ්ඩා සහ වෙනත් අය උරුමකම් කියන ඉඩම ද, බස්නාහිරට : ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ වූ ඉඩම ද, පාර සහ ආර්. එම්. සුදු බණ්ඩා උරුමකම් කියන ඉඩම ද මායිම්ව මේ සීමාවන් තුළ අක්කර එකයි රූඩ් තුනක් සහ පර්චස් දහඅටක (අ. 1, රූ. 3, පර්. 18) වපසරියකින් යුක්තවන අතර එහි ඇති අනෙකුත් සියලු දේද වේ.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඩී. එම්. ඒ. දිසානායක,
කළමනාකරු.

ලංකා බැංකුව,
ලුනුවත්ත.

06-109

---

### ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ දැන්වීම

2009.03.12 වැනි දින පවත්වන ලද රැස්වීමකදී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. මහජන නොතාරිස් ජේ. එල්. සරත්චන්ද්‍ර විසින් සහතික කරන ලද 2007.10.10 වැනි දිනැති අංක 366 දරන බැඳුම්කරය මත මුල් මුදල හා 2009.01.26 වැනි දින තෙක් පොලිය වශයෙන් රුපියල් දහනව ලක්ෂ හතලිස් දෙදහස් හයසිය දහඅටයි ශත අසූහතක (රු. 19,42,618.87) මුදලක් සමග රුපියල් දහඅටලක්ෂයක (රු. 18,00,000) මුදලක් මත වසරකට සියයට විසිනවය, (29%) බැගින් පොලියක් ද, 2009.01.27 වැනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් ඇඹිලිපිටිය, පල්ලේගම, නිව් කුමාර වෙල්ඩින් වර්ක්ස් හි පදිංචි දඩල්ලගේ රුවන් කුමාර මහතාගෙන් සහ ඇඹිලිපිටිය, පල්ලේගම කුමාර හාඩ්වෙයා හි පදිංචි දඩල්ලගේ සුරංග කුමාර මහතාගෙන් අයවිය යුතුව ඇත

2. එකී අංක 366 දරන බැඳුම්කරය මත අයවිය යුතු එකී රුපියල් දහනවලක්ෂ හතලිස් දෙදහස් හයසිය දහඅටයි ශත අසූහතක (රු. 19,42,618.87) මුදල සමග 2009.01.27 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොලිය ද, ලංකා බැංකු ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල්ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට මහනුවර, ටොරින්ටන් පාර, අංක 24හි පදිංචි වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහත්වරුන්ට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වැනි වගන්තිය යටතේ ද, ලංකා බැංකු ආඥාපනතේ 21 වැනි වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පළ කිරීමට ඇඹිලිපිටිය ලංකා බැංකු ශාඛාවේ කළමනාකරුට ද මෙයින් අවසරදී බලය පවරනු ලැබේ.

### උපලේඛනය

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කොළොන්න කෝරළේ, දියපොතගම් පත්තුවේ, ඇඹිලිපිටිය නගර සභා සීමාවේ ඇඹිලිපිටිය පල්ලේගම පිහිටි වැවකුඹුරේ කොටස නමැති ඉඩමට එහි ඇති ගොඩනැගිලි ගහකොළ සහ වෙනත් සියළු දේද ඇතුළත්ව බලයලත් මිනින්දෝරු ජී. ඩබ්. කේ. මනම්පේරි විසින් සාදන ලද 2005.12.24 දිනැති අංක 2636 දරන පිඹුරෙහි ලොට් "ඒ" ලෙස සටහන් කර නිරූපනය කොට මායිම් නිර්ණය

කොට ඇති බෙදූ ඉඩම් කැබැල්ල, උතුරට : එම ඉඩමේම කොටසක් ද, නැගෙනහිරට : එම ඉඩමේම කොටසක් සහ ලොට් බී ද, දකුණට : ලොට් බී සහ ප්‍රධාන පාර ද, බස්නාහිරට : එම ඉඩමේම කොටසක් ද, මායිම්ව පර්චස් නවයයි දශම දෙකයි දෙකයි හතරක (අ. 0, රූ. 0, පර්. 09.224) වපසරියකින් යුක්ත වන අතර, මෙය රත්නපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී 68/223 ශීර්ෂය යටතේ ලියාපදිංචි කර ඇත.

පෙර කී ඇඹිලිපිටිය පල්ලේගම පිහිටි වැවකුඹුර කොටස නමැති ඉඩමෙහි අංක 2636 දරන පිඹුරෙහි ලොට් බී ලෙස සටහන් කර නිරූපනය කර මායිම් නිර්ණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල උතුරට : ලොට් ඒ ද, නැගෙනහිරට : එම ඉඩමේම කොටසක් ද, දකුණට : ප්‍රධාන පාර ද, බස්නාහිරට : ලොට් ඒ ද මායිම්ව පර්චස් හතරයි දශම තුනයි හතයි බිංදුවක (අ. 0, රූ. 0, පර්. 4.370) වපසරියකින් යුක්ත වන අතර මෙය රත්නපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී 242/92 ශීර්ෂය යටතේ ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එච්. එම්. ඒ. බණ්ඩාර,
කළමනාකරු.

ලංකා බැංකුව,
ඇඹිලිපිටිය.

06-111

---

## ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ දැන්වීම

2009.03.12 වැනි දින පවත්වන ලද රැස්වීමකදී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. මහජන නොතාරිස් ඒ. ඩබ්. අමරතුංග විසින් සහතික කරන ලද 2007.09.29 වැනි දිනැති අංක 577 දරන බැඳුම්කරය මත මුල් මුදල හා 2009.01.15 වැනි දින තෙක් පොලිය වශයෙන් රුපියල් අටලක්ෂ හැටහතර දහස් හයසිය දොළහයි ශත තිස්නවයක (රු. 8,64,612.39) මුදලක් සමග රුපියල් හයලක්ෂ අනූහය දහස් තුන්සිය අනූහතයි ශත විසිඅටක (රු. 6,96,397.28) මුදලක් මත වසරකට සියයට විසිනවය, (29%) බැගින් පොලියක් ද, 2009.01.16 වැනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් ඇඹිලිපිටිය, පල්ලේගම, රත්නපුර පාර, කුමාර හාඩ්වෙයා හි පදිංචි දඩල්ලගේ සුරංග කුමාර මහතාගෙන් සහ තුන්කම හල්මිල්ලකැටිය, අංක 30හි පදිංචි මැද්දේගම වහුම්පුරගේ සිරිපාල මහතා සහ කඹුරුගමුවගේ හාමිනා මහත්මිය යන අයගෙන් අයවිය යුතුව ඇත

2. එකී අංක 577 සහ 2007.09.29 වැනි දින දරන බැඳුම්කරය මත අයවිය යුතු එකී රුපියල් අටලක්ෂ හැටහතර දහස් හයසිය දොළහයි ශත තිස්නවයක (රු. 8,64,612.39) මුදල සමග 2009.01.06 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොලිය ද, ලංකා බැංකු ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල්ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට මහනුවර, ටොරින්ටන් පාර, අංක 24හි පදිංචි වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහත්වරුන්ට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වැනි වගන්තිය යටතේ ද, ලංකා බැංකු ආඥාපනතේ 21 වැනි වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පළ කිරීමට ඇඹිලිපිටිය ලංකා බැංකු ශාඛාවේ කළමනාකරුට ද මෙයින් අවසරදී බලය පවරනු ලැබේ.

### උපලේඛනය

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කොළොන්න කෝරළේ, දියපොතගම් පත්තුවේ, තුන්කම ග්‍රාමයෙහි පිහිටි තපස්ගලයාය නමැති ඉඩමෙහි සර්වේයර් ජනරාල් විසින් සහතික කරන ලද අංක අයි. එස්. පී. පී. 2 දරන පිඹුරෙහි ලොට් 153 ලෙස දක්වා මායිම් නිර්ණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල උතුරට : ලොට් 146 ද, නැගෙනහිරට : ලොට් 152 ද, දකුණට : ලොට් 168 ද. බස්නාහිරට : ලොට් 154 ද මායිම් ව අක්කර දෙකයි රූඩ් එකයි පර්චස් තිස්පහක (අ. 02, රූ. 1, පර්. 35) වපසරියකින් යුක්ත වන අතර එහි ඇති වෙනත් සියළු දේද වේ. මෙය රත්නපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ස්වර්ණභූමි ඉ. සං. 12/536 ශීර්ෂය යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එච්. එම්. ඒ. බණ්ඩාර,
කළමනාකරු.

ලංකා බැංකුව,
ඇඹිලිපිටිය.

06-112

---

## කොමර්ෂල් බැන්ක් ඔප් සිලෝන් පී. එල්. සී.

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි (ලියාපදිංචි අංක පී. කිව්. 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ණය ගිණුම් අංක : 1970002287 සහ 237838

2008 සැප්තැම්බර් මස 2 වැනි දින පවත්වන ලද කොමර්ෂල් බැන්ක් ඔප් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කරගන්නා ලදී.

ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් අයි. එස්. විජේසේකර විසින් 2005 මැයි මස 10 වැනි දින සහතික කරන ලද අංක 1834 සහ 2007 ජූලි මස 17 වැනි දින සහතික කරන ලද අංක 2908 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලොන් ලිමිටඩ් (දැන් කොමර්ෂල් බැන්ක් ඔප් සිලෝන් පී. එල්. සී.) හි නමට ලියන ලද්දාවූ බැඳුම්කර යටතේ අයවිය යුතු මුදල් ගෙවීම මාවනනෙ හේවා දිමුත් විභූති ද සිල්වා සහ හෙට්ටි කන්කානම්ගේ රෝහිණී නානායක්කාර ණයකරුවන්/උකස්කරු හැටියට ද, පැහැරහැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් දහසය ලක්ෂ පනස්හය

දහස් එකසිය දාහතරයි ශත හතලිහක (රු.1,656,114.40) මුදලක් 2008 සැප්තැම්බර් මස 2 වැනි දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් දහසය ලක්ෂ පනස් හය දහස් එකසිය දාහතරයි ශත හතලිහක (රු.1,656,114.40) මුදලට 2008 සැප්තැම්බර් මස 3 වැනි දින සිට දේපල විකිණීමේ දිනය දක්වා කාලයට (රු. 1,037,939.92) ක මුදල මත 33%ක වැඩිදුර වාර්ෂික පොලිය හා රු. 391,700ක මුදල මත 22%ක වැඩිදුර වාර්ෂික පොලිය ද, ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද, තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදලත් අඩුකොට එකී අංක 1834 සහ 2908 දරන බැඳුම්කර මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් පී. එල්. සී. වෙත උකස්කොට ඇත්තාවූ ද, මෙහි පහත උපලේඛනයේ සවිස්තරව කර ඇත්තාවූ ද, දේපල සහ පරිශ්‍රය කොළඹ 12, හල්ප්ස්ඩෝප් වීදියේ, අංක 99 හි බලයලත් වෙන්දේසිකාර එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කරගනී.

### උපලේඛනය

බලයලත් මානක ඩබ්ලිව්. ජී. ඩී. යූ. කරුණාරත්න විසින් 2002 ජනවාරි මස 28 වැනි දින සාදන ලද අංක 14/2002 දරන පිඹුර පරිදි දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, වැල්ලබොඩ පත්තුව, බටපොල පිහිටි ගොඩනැගිලි, වගාවන් සහ සියළු දේත් සමග වූ මිල්ලගහවත්ත ඉඩමේ ලොට් "සී" සහ ලොට් "ඩී" හි කොටසක් වන යාබද සහ ඒකාබද්ධ ලොට් "සී 2" කියන ඉඩමේ බෙදා වෙන් කරන ලද ලොට් සී2ඒ දරන කොටසට මායිම්,

වයඹ දිගට සහ උතුරට : අංක 14/2002 දරන පිඹුරේ පෙන්වා ඇති පරිදි ලොට් "සී 1" ද, නැගෙනහිරට : උඩුවිල ඇත්කඳුර පාර ද, දකුණට : අංක 14/2002 දරන පිඹුරේ පෙන්වා ඇති පරිදි ලොට් සී2බී ද, යන මායිම් තුල එකී අංක 14/2002 දරන පිඹුර පරිදි පර්චස් අටයි දශම හයයි බිංදුවක් (අක්කර 0, රූඩ් 0, පර්චස් 8.60) විශාල ඉඩම ගාල්ල දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 799/170 (cross Referance to C758/241) යටතේ ලියාපදිංචිව ඇත.

2. බලයලත් මානක ඩබ්ලිව්. ජී. ඩී. යූ. කරුණාරත්න විසින් 2002 ජනවාරි මස 28 වැනි දින සාදන ලද අංක 14/2002 දරන පිඹුර පරිදි එකී බටපොල පිහිටි මිල්ලගහවත්ත ඉඩමේ ලොට් "ඩී" හි කොටසක් සහ ලොට් "සී" දරන යාබද සහ ඒකාබද්ධ ඉඩමේ ගොඩනැගිලි, වගාවන් සහ සියළු දේත් සමග බෙදා වෙන්කරන ලද ලොට් "සී2බී" දරන කොටසට මායිම්, උතුරට : අංක 14/2002 දරන පිඹුරේ පෙන්වා ඇති පරිදි ලොට් "සී2ඒ " ද, නැගෙනහිරට : උඩුවිල-ඇත්කඳුර පාර ද, දකුණට : එකී අංක 14/2002 දරන පිඹුරේ පෙන්වා ඇති පරිදි ලොට් "ඩී 1" ද, බස්නාහිරට : ලොට් "සී 3ඒ2" ද, යන මායිම් තුල එකී අංක 14/2002 දරන පිඹුර පරිදි පර්චස් දහහතරයි දශම දෙකයි පහක් (අක්කර 0, රූඩ් 0, පර්චස් 14.25) විශාල ඉඩම ගාල්ල දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 797/169 යටතේ (with cross Referance to C757/206) යටතේ ලියාපදිංචිව ඇත.

ආර්. ආර්. දුනුවිල මහත්මිය,
සමාගම් ලේකම්.

06-90

### ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ දැන්වීම

2009.03.12 වැනි දින පවත්වන ලද රැස්වීමකදී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. මහජන නොතාරිස් ඒ. ඩබ්. අමරතුංග මහතා විසින් සහතික කරන ලද 2007.04.03 වැනි දිනැති අංක 527 දරන බැඳුම්කරය මත මුල් මුදල හා 2008.12.31 වැනි දින තෙක් පොලිය වශයෙන් රුපියල් දෙලක්ෂ තිස්හතර දහස් හත්සිය විසිපහක (රු. 2,34,725) මුදලක් සමග රුපියල් එක්ලක්ෂ හැත්තෑනවදහස් නවසිය අනූවක (රු. 1,79,990) මුදලක් මත වසරකට සියයට විසිනවය (29%) බැගින් පොළියක් ද, 2009.01.01 වැනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් ඇඹිලිපිටිය, නවර නගරය, සිළුම්ණිගම හි පදිංචි හද්දොකාරගෙදර සිරිල් රාජපක්ෂ මහතා සහ අරබාගේ මල්ලිකා මහත්මිය යන අයගෙන් අයවිය යුතුව ඇත.

2. මහජන නොතාරිස් ඒ. ඩබ්. අමරතුංග මහතා විසින් සහතික කරන ලද එකී අංක 527 සහ 2007.04.03 වැනි දින දරන බැඳුම්කරය මත අයවිය යුතු එකී රුපියල් දෙලක්ෂ තිස්හතර දහස් හත්සිය විසිපහක (රු. 2,34,725) මුදල සමග 2009.01.01 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොළිය ද, ලංකා බැංකු ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගතහැකි ගාස්තු හා මුදල්ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට මහනුවර, ටොරින්ටන් පාර, අංක 24හි පදිංචි වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහත්වරුන් හට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වැනි වගන්තිය යටතේ ද, ලංකා බැංකු ආඥාපනතේ 21 වැනි වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පළ කිරීමට ඇඹිලිපිටිය, ලංකා බැංකු ශාඛාවේ කළමනාකරුටද මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

### උපලේඛනය

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, දියපොතගම්පත්තුවේ, උඩගම ඇඹිලිපිටිය පිහිටි සර්වේයර් ජනරාල් විසින් සහතික කරන ලද F.V.P. 778/22හි ලොට් 3461 ලෙස දක්වා මායිම් නිර්ණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල, උතුරට : ලොට් 3437 ද, නැගෙනහිරට : ලොට් 3437 ද, දකුණට : ලොට් 3460 ද, බස්නාහිරට : ලොට් 3414 (පාර) ද, මායිම්ව හෙක්ටයාර් බිංදුවයි දශම දෙකයි අටයි පහක (හෙක්. 0.285) වපසරියකින් යුක්තවන අතර, එහි ඇති වෙනත් සියලු දේද වේ. මෙය රත්නපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජයභූමි ඉසං. 13/1692 ශීර්ෂය යටතේ ලියාපදිංචි කර ඇත.

එච්. එම්. ඒ. බණ්ඩාර,
කළමනාකරු.

ලංකා බැංකුව,
ඇඹිලිපිටිය.

06-114

## කඳුරට සංවර්ධන බැංකුව

1997 අංක 06 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනතේ 43(ආ) වගන්තිය හා 1990 අංක 04 දරන බැංකු මඟින් ප්‍රදානිත ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වගන්තිය ප්‍රකාර කඳුරට සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008.11.27 වැනි දින සම්මත කරන ලද යෝජනාව

කඳුරට සංවර්ධන බැංකුව වෙනුවෙන් මාතලේ නීතිඥ හා ප්‍රසිද්ධ නොතාරිස් එල්. ආර්. ගාමිණී විජේතුංග මහතා විසින් ලියා සහතික කරන ලද 2006.03.20 දිනැති අංක 563 දරන උකස්කරය ප්‍රකාර බැංකුවට අයවිය යුතුව ඇති මුදල් ගෙවීම දඹුල්ල, දඹුළුගම, අංක 29 යන ලිපිනයෙහි පදිංචි ක්‍රිස්තෝම්බු බදුගේ ගාමිණී යන අය විසින් පැහැර හැර ඇති හෙයින් 2008.10.31 දිනට යථෝක්ත උකස්කරය යටතේ බැංකුවට අයවිය යුතුව ඇති රුපියල් දොලොස් ලක්ෂ අටදහස් අනූ දෙකයි ශත පනස් එක (රු. 12,08,092.51) ක් වූ මුදල හා එදින සිට රුපියල් නවලක්ෂ දාහත් දහස් අටසිය හතලිස් තුනයි ශත විසිනමය (රු. 9,17,843.29) සඳහා වාර්ෂිකව 24.58% බැගින් විකිණීමේ දිනය දක්වා පොළිය අයවි යුතුව හා ණයව ඇති හෙයින් පූර්වෝක්ත බැංකුවට පූර්වෝක්ත උකස්කර අංක 563 මගින් උකස් කරනු ලැබුවා වූ ද,

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ උතුරු කොට්ඨාසයේ වගපනහ පල්ලේසිය පත්තුවේ දඹුල්ලේ පිහිටි "ගල්කරුයායගාවා කටුපොත සහ කටුපොත" නමැති නැගෙනහිරට : ත්‍රිකුණාමල මහපාරද, දකුණට: සිසිලින් නෝනාගේ ඉඩම සහ බෝක්කු ඇලද, බස්නාහිරට : කටුපොත ද, උතුරට : පී. ඩී. ගුණවර්ධගේ ගුණවර්ධනගේ ඉඩමේ වැටද මායිම් වූ අක්කර හතරක් (අක්. 04, රූඩ් 0, පර්. 0) පවත්නා විශාල ඉඩමේ බෙදා වෙන්කළ කොටසක් වන ඒ. ජී. ඩබ්. ගිරාගම වරලත් මිනින්දෝරු මහතා විසින් 1986.12.08 දින මැන සාදන ලද අංක 974 දරන පිඹුරේ ප්‍රකාර කැබලි අංක බී දරන පර්චස් තිස් හය (අක්. 0, රූඩ්. 0, පර්. 36) ක් විශාල බිම් වාසියට මායිම්,

(02) උතුරට : පී. ඩී. ගුණවර්ධනට අයිති හේනේ කම්බි වැටද, නැගෙනහිරට : අනුරාධපුර සිට මාතලේට යන මහ පාර දිගට අත්හැර ඇති බිම් වාසිය ද, බස්නාහිරට : ඉහත කී පිඹුරේ "ඒ" අක්ෂරය දරන කොටස ද, දකුණට : ඉහත කී පිඹුරේ සඳහන් "සී" අක්ෂරය දරණ බිම් කොටසද යන මෙකී මායිම් තුල පිහිටි ඉඩම සහ ඊට අයිති සියළු දෙයිනුත් මැන බෙදා වෙන් කළ කොටසක් කියන මාතලේ දිස්ත්‍රික්කයේ බලයලත් මිනින්දෝරු තැන වන ඒ. එම්. අනුරරත්න මහතා විසින් මැන සකස් කළ 2005.07.07 දිනැති අංක 2923 දරන පිඹුරේ ප්‍රකාර කැබලි අංක 02 දරන ප්‍රමාණයෙන් පර්චස් තිස්තුනයි දශම දෙකක් (අක්. 0, රූඩ්. 0, පර්. 33.2) විශාල කටුපොතයාය නමැති ඉඩම

(03) උතුරට : පී. ඩී. ගුණවර්ධන හිමිකම් කියන කටුපොත යායද, නැගෙනහිරට : ප්‍රධාන පාර රක්ෂිතය සහ කැබලි අංක 01ඒ සහ 01 බී ද, දකුණට : බලයලත් මිනින්දෝරු කේ. සමරසිංහ මහතා විසින් මැන සහතික කල අංක 3134 දරන පිඹුරේ කැබලි අංක "ඒ" ද, බස්නාහිරට : අඩි දහය (අඩි 10) ක් පළල පාරද යන මෙම මායිම් තුල පිහිටි ඉඩම සහ ඊට අයිති ගොඩනැගිලි ඇතුළු සෑම සියළු දේත් ද වේ.

මෙම උකස මාතලේ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ඩී 334/235 යටතේ 2006.03.23 දින ලියාපදිංචි කර ඇත.

යථොක්ත මුදල හෝ විකිණීම කරන අවස්ථාව වන විට නොගෙවා ඉතිරිව ඇති කවර හෝ කොටසක් ද, ප්‍රචාරය හා විකිණීම සඳහා දරන්නට සිදුවන වියදම් ද, තීරණයේ දිනට පසුව කරන ලද ගෙවීම් අඩුකර අයකර ගැනීම පිණිස යථෝක්ත පනතේ විධිවිධානවලට අනුව බැංකුවේ ලියාපදිංචි වෙන්දේසිකරු වන ෂොක්මන් සහ සමරවික්‍රම ආයතනය මඟින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට කඳුරට සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරනු ලැබේ.

එච්. එම්. කේ. බී. හෙල්ලරාව,
සාමාන්‍යාධිකාරී.

කඳුරට සංවර්ධන බැංකුව,
ප්‍රධාන කාර්යාලය,
අංක 130, කටුගස්තොට පාර,
මහනුවර.

06-08/5

---

## කඳුරට සංවර්ධන බැංකුව

1997 අංක 06 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනතේ 43(ආ) වගන්තිය හා 1990 අංක 04 දරන බැංකු මඟින් ප්‍රදානිත ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වගන්තිය ප්‍රකාර කඳුරට සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008.11.27 වැනි දින සම්මත කරන ලද යෝජනාව

කඳුරට සංවර්ධන බැංකුව වෙනුවෙන් මහනුවර නීතිඥ හා ප්‍රසිද්ධ නොතාරිස් ආර්. ඩබ්. එම්. බී. ඩබ්. බන්දුල රත්නායක මහතා විසින් ලියා සහතික කරන ලද 2006.10.16 දිනැති අංක 11411 දරන උකස්කරය ප්‍රකාර බැංකුවට අයවිය යුතුව ඇති මුදල් ගෙවීම ලෙවිල, කැටවල, ග්‍රීන් ගාර්ඩන් යන ලිපිනයෙහි පදිංචි සෙල්ලදොරේ පන්නිර්සෙල්වම් හෙවත් රෙන්ගසාමි සෙල්ලදොරේ පන්නිර්සෙල්වම් යන අය විසින් පැහැර හැර ඇති හෙයින් 2008.10.31 දිනට යථෝක්ත උකස්කරයට යටතේ බැංකුවට අයවිය යුතුව ඇති රුපියල් තුන්ලක්ෂ පනස් නවදහස් හත්සිය හැත්තෑ එකයි ශත තිස් හය (රු. 3,59,771.36) ක් වූ මුදල හා එදින සිට රුපියල් දෙලක්ෂ අසූ හතරදාස් නවසිය අනූ දෙකයි ශත පනස් පහ (රු. 2,84,992.55) සඳහා වාර්ෂිකව 24.58% බැගින් විකිණීමේ දිනය දක්වා පොළිය අයවිය යුතුව හා ණයව ඇති හෙයින් පූර්වෝක්ත බැංකුවට පූර්වෝක්ත උකස්කර අංක 11411 මගින් උකස් කරනු ලැබුවා වූ ද,

(01) මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පාතහේවාහැට ගම්දහය කෝරලේ කොස්හින්න පිහිටි කොස්හින්න වත්ත නැමැති ඉඩමට බලයලත් කේ. එච්. එම්. නවරත්න මහතා විසින් 1993.09.08 දින මැන සාදන ලද අංක 9150 දරන පිඹුරේ ප්‍රකාර කැබලි අංක 05 දරන රූඩ් තුනයි පර්චස් එකොලහක් (අක්. 0, රූඩ්. 03, පර්. 11) ක් විශාලකමට මායිම් උතුරට : කැබලි අංක 07 දරන පාර ද, නැගෙනහිරට : කැබලි අංක 04 සහ පිඹුරු අංක 838 හි සඳහන් කොස්හින්න වත්ත ද, දකුණට : ඇල ද සහ බස්නාහිරට: කැබලි අංක 05 නිවැරැදිව කැබලි අංක 06 ද යන මායිම් තුල ඉඩම සහ එහි තුළ පිහිටි සෑම සියළු දේත්ද සහ එකී ඉඩමට ප්‍රවේශවීමට ඇති මාර්ගයන්හි මාර්ග අයිතියද,

(2) ඉහත කී කොස්හින්න පිහිටි කොස්හින්න වත්ත නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. එම්. එච්. නවරත්න මහතා විසින් 1993.09.08 සහ 1996.10.23 දින මැන බෙදා සාදන ලද අංක 9150 දරන පිඹුරේ ප්‍රකාර කැබලි අංක 06බී දරන පර්චස් තුනක් (අ. 0, රූඩ්. 0, පර්. 3) විශාලකමට මායිම්, උතුරට : කැබලි අංක 07 දරන අඩි තුනක් පළල පාර ද, නැගෙනහිරට: කැබලි අංක 05 ද, දකුණට : කැබලි අංක 06ක් ද, සහ බස්නාහිරට : පිඹුරු අංක 1196 එහි කැබලි අංක 02 දරන පාරද යන මායිම් තුළ මාර්ගයේ මාර්ග සහ වෙනත් පරවශතා අයිතියද,

(3) ඉහත කී ලෙව්ල පිහිටි පත්ගොල්ලේ වත්ත අත්තාරුගොඩ හේන, හපුගහමුලහේන, කළුවැහේන, මඩමයගාවහේන නොහොත් වත්ත අංගරුගොඩහේන, කැකුලේ වත්ත, අත්තරුගොඩ සහ පුරන්කුඹුර කැබලි අංක 02 ඒ පුරන්කුඹුරේ වත්ත, කැබලි අංක 01 ඒ සහ ගෙටඋඩවත්ත නොහොත් රත්ගිරියේ වත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. එම්. එම්. නවරත්න මහතා විසින් 1995.07.11 සහ 1996.10.23 මැන උප බෙදා සාදන ලද අංක 1196 ඒ පිඹුරේ ප්‍රකාර කැබලි අංක 02 දරන පර්චස් දෙකයි දශම පහයි බින්දුවක් (අක් . 0, රූඩ්. 0, පර්. 2.50) විශාලකමට මායිම් උතුරට : සෙල්ලදොරේට අයත් ඉඩම ද, නැගෙනහිරට : කැබලි අංක 01 ද, දකුණට : සෙල්ලදොරේට අයත් ඉඩමද සහ බස්නාහිරට : මෙම ඉඩමේ කොටසක්ද යන මායිම් තුළ අඩි 10 පළල ප්‍රවේශ මාර්ගය සඳහා වෙන්කළ යුතු වේ.

මෙම උකස මහනුවර ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ පී 326/266 යටතේ 2006.10.23 දින ලියාපදිංචි කර ඇත.

යථෝක්ත මුදල හෝ විකිණීම කරන අවස්ථාව වන විට නොගෙවා ඉතිරිව ඇති කවර හෝ කොටසක් ද, ප්‍රචාරය හා විකිණීම සඳහා දරන්නට සිදුවන වියදම් ද, තීරණයේ දිනට පසුව කරන ලද ගෙවීම් අඩුකර අයකර ගැනීම පිණිස යථෝක්ත පනතේ විධිවිධානවලට අනුව බැංකුවේ ලියාපදිංචි වෙන්දේසිකරු වන ෂොක්මන් සහ සමරවික්‍රම ආයතනය මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට කඳුරට සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරනු ලැබේ.

එච්. එම්. කේ. බී. හෙල්ලරාව,
සාමාන්‍යාධිකාරී.

කඳුරට සංවර්ධන බැංකුව,
ප්‍රධාන කාර්යාලය,
අංක 130, කටුගස්තොට පාර,
මහනුවර.

06-08/4

---

**කඳුරට සංවර්ධන බැංකුව**

1997 අංක 06 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනතේ 43 (ආ) වගන්තිය හා 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානිත ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වගන්තිය ප්‍රකාර කඳුරට සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008.11.27 දින සම්මත කරන ලද යෝජනාව

කඳුරට සංවර්ධන බැංකුව වෙනුවෙන් මහනුවර නීතිඥ හා ප්‍රසිද්ධ නොතාරිස් සුනිල් කේ. අමරතුංග මහතා විසින් ලියා සහතික කරන ලද 2006.10.02 දිනැති අංක 3408 දරන උකස්කරය ප්‍රකාර බැංකුවට අයවිය යුතුව ඇති මුදල් ගෙවීම ගුරුදෙනිය, මාලිගාතැන්න, "නන්දසිරි" යන ලිපිනයෙහි පදිංචි රංජිත් පද්මසිරි ගාල්ලගේ සහ කෝදාගොඩ හෙට්ටිගේ අනුලා ඉන්දුමතී යන අය විසින් පැහැර හැර ඇති හෙයින් 2008.10.31 දිනට යථෝක්ත උකස්කරය යටතේ බැංකුවට අයවිය යුතුව ඇති රුපියල් හතලිස් නවලක්ෂ අසූනමදහස් එකසිය එකයි ශත අසූ පහක් (රු. 49,89,101.85) ක් වූ මුදල හා එදින සිට රුපියල් තිස්නව ලක්ෂ දහතුන්දාස් හත්සිය හැට හයයි ශත දහඅට (රු. 39,13,766.18) සඳහා වාර්ෂිකව 24.58% බැගින් විකිණීමේ දිනය දක්වා පොළිය අයවිය යුතුව හා ණයව ඇති හෙයින් පූර්වෝක්ත බැංකුවට පූර්වෝක්ත උකස්කර අංක 3408 මගින් උකස් කරනු ලැබුවා වූ ද,

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පාතහේවාහැට, ගම්දහය උතුරු කෝරලේ, ගුරුදෙනිය ගමේ පිහිටි හාරගම ගෘහ නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩී. එල්. ඩී. වයි. විජේවර්ධන මහතා විසින් 1999.12.12 වන දින මැන සාදන ලද අංක 9394 දරන පිඹුරේ ප්‍රකාර කැබලි අංක 04 දරන ඉඩම් කට්ටිය වන උතුරට : පාර සහ කැබලි අංක 05 ද, නැගෙනහිරටः කැබලි අංක 05, සහ අංක 972බී දරණ පිඹුරේ කැබලි අංක බී හි ඉතිරි කොටස ද, දකුණට : කැබලි අංක 03 සහ අංක 972 බී දරණ පිඹුරේ කැබලි අංක බී හි ඉතිරි කොටස ද, බස්නාහිරට : කැබලි අංක 03 සහ පාරද යන මායිම් තුළ පිහිටි රූඩ් එකයි පර්චස් තිහක් (අක්. 0, රූඩ්. 01, පර්. 30) ක් විශාල ඉඩම සහ එහි තුළ පිහිටි ගොඩනැගිලි ඇතුළු සෑම සියළු දේත් ද වේ.

මෙම උකස මහනුවර ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ පී 376/221 යටතේ 2006.10.03 දින ලියාපදිංචි කර ඇත.

යථෝක්ත මුදල හෝ විකිණීම කරන අවස්ථාව වන විට නොගෙවා ඉතිරිව ඇති කවර හෝ කොටසක් ද, ප්‍රචාරය හා විකිණීම සඳහා දරන්නට සිදුවන වියදම් ද, තීරණයේ දිනට පසුව කරන ලද ගෙවීම් අඩුකර අයකර ගැනීම පිණිස යථෝක්ත පනතේ විධිවිධානවලට අනුව බැංකුවේ ලියාපදිංචි වෙන්දේසිකරු වන ෂොක්මන් සහ සමරවික්‍රම ආයතනය මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට කඳුරට සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරනු ලැබේ.

එච්. එම්. කේ. බී. හෙල්ලරාව,
සාමාන්‍යාධිකාරී.

කඳුරට සංවර්ධන බැංකුව,
ප්‍රධාන කාර්යාලය,
අංක 130, කටුගස්තොට පාර,
මහනුවර.

06-08/3

---

**කඳුරට සංවර්ධන බැංකුව**

1997 අංක 06 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනතේ 43 (ආ) වගන්තිය හා 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානිත ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වගන්තිය ප්‍රකාර කඳුරට සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.03.27 දින සම්මත කරන ලද යෝජනාව

කඳුරට සංවර්ධන බැංකුව වෙනුවෙන් මාතලේ නීතිඥ හා ප්‍රසිද්ධ නොතාරිස් එන්. ඒ. ඩබ්. එම්. ආර්. ජේ. සී. දෙහිගම මෙනවිය විසින් ලියා සහතික කරන ලද 2001.11.01 දිනැති අංක 2806 දරන උකස්කරය ප්‍රකාර බැංකුවට අයවිය යුතුව ඇති මුදල් ගෙවීම පලාපත්වල, කිරිගල්පොත්ත, අංක 8/2 යන ලිපිනයෙහි පදිංචි හරස්ගම වලව්වේ ගෙදර විජිතපාල යන අය විසින් පැහැර හැර ඇති හෙයින් 2009.02.28 දිනට යථෝක්ත උකස්කරය යටතේ බැංකුවට අයවිය යුතුව ඇති රුපියල් (හැත්තෑහතරදාස් හත්සිය දාහතරයි ශත හැත්තෑ හය) රුපියල් (74,714.76) ක් වූ මුදල හා එදින සිට රුපියල් (හතලිස්පන්දාස් දෙසිය තිස් තුනයි ශත අසූහය) (රු. 45,233.86) සඳහා වාර්ෂිකව 20% බැගින් විකිණීමේ දිනය දක්වා පොළිය අයවිය යුතුව හා ණයව ඇති හෙයින් පූර්වෝක්ත බැංකුවට පූර්වෝක්ත උකස්කර අංක 2806 මගින් උකස් කරනු ලැබුවා වූ ද,

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ දකුණු කොට්ඨාසයේ ගම්පහසිය පත්තුවේ, කිරිගල්පොත්තේ පිහිටි - නිකවෙල එස්ටේට් කියන ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ. පී. ඩබ්. ගිරාගම මහතා විසින් 1994.07.11

දින මැන සාදන ලද අංක 3374 දරන පිඹුරේ ප්‍රකාර බෙදා වෙන් කළ පර්චස් හතක් (අක්කර. 0, රූඩ්. 0, පර්. 07) ක් විශාලකමට මායිම් උතුරට: අඩි 15ක් පළල පාරක් සඳහා වෙන්කළ බිම ද, නැගෙනහිරට : අංක 3374 දරන පිඹුරේ කැබලි අංක බී ද, දකුණට : අංක 2967 දරන පිඹුරේ සඳහන් ඇල සහ කැබලි අංක 09 ද, බස්නාහිරට : අඩි 10ක් පළල පාරද යන මායිම් තුළ පිහිටි ඉඩම් සහ ගොඩනැගිලි ඇතුළු සෑම සියළු දේත් ද වේ.

ඉහත දේපල හිමිව ඇත්තේ 1994.07.11 දින ප්‍රසිද්ධ නොතාරිස් එම්. වයි. එම්. තවුෆික් මහතා විසින් ලියා සහතික කළ අංක 1661 දරන ඔප්පුව පිට වේ.

මෙම උකස මාතලේ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ බී 310/291 යටතේ 2001.11.01 දින ලියාපදිංචි කර ඇත.

යථෝක්ත මුදල හෝ විකිණීම කරන අවස්ථාව වන විට නොගෙවා ඉතිරිව ඇති කවර හෝ කොටසක් ද, ප්‍රචාරය හා විකිණීම සඳහා දරන්නට සිදුවන වියදම් ද, තීරණයේ දිනට පසුව කරන ලද ගෙවීම් අඩුකර අයකර ගැනීම පිණිස යථෝක්ත පනතේ විධිවිධානවලට අනුව බැංකුවේ ලියාපදිංචි වෙන්දේසිකරු වන ෂොක්මන් සහ සමරවික්‍රම ආයතනය මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට කඳුරට සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරනු ලැබේ.

එච්. එම්. කේ. බී. හෙල්ලරාව,
සාමාන්‍යාධිකාරී.

කඳුරට සංවර්ධන බැංකුව,
ප්‍රධාන කාර්යාලය,
අංක 130, කටුගස්තොට පාර,
මහනුවර.

06-08/2

---

## කඳුරට සංවර්ධන බැංකුව

### 1997 අංක 06 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනතේ 43 (ආ) වගන්තිය හා 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානිත ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වගන්තිය ප්‍රකාර කඳුරට සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.03.27 දින සම්මත කරන ලද යෝජනාව

කඳුරට සංවර්ධන බැංකුව වෙනුවෙන් ගම්පහ නීතිඥ හා ප්‍රසිද්ධ නොතාරිස් නයනානන්ද අළුත්ගමගේ මහතා විසින් ලියා සහතික කරන ලද 2008.04.10 දිනැති අංක 2680 දරන උකස්කරය ප්‍රකාර බැංකුවට අයවිය යුතුව ඇති මුදල් ගෙවීම උඩබුලත්ගම, අඹගමුව, අම්බලන්ඕවිට යන ලිපිනයෙහි පදිංචි උඩගෙදර මුදියන්සේලාගේ පොඩි රාලහාමි සහ උඩගෙදර මුදියන්සේලාගේ නිලන්ත යසිත පොඩි රාලහාමි යන අය විසින් පැහැර හැර ඇති හෙයින් 2009.02.28 දිනට යථෝක්ත උකස්කරය යටතේ බැංකුවට අයවිය යුතුව ඇති (රුපියල් එක්ලක්ෂ හැත්තෑතුන්දහස් හයසිය තිස් නවයයි ශත හතලිස් පහ) (රු. 1,73,639.45) ක් වූ මුදල හා එදින සිට (රුපියල් එක්ලක්ෂ හැටදාහක්) (රු. 1,60,000.00) සඳහා වාර්ෂිකව 28% බැගින් විකිණීමේ දිනය දක්වා පොලිය අයවිය යුතුව හා ණයව ඇති හෙයින් පූර්වෝක්ත බැංකුවට, පූර්වෝක්ත උකස්කර අංක 2680 මගින් උකස් කරනු ලැබුවා වූද,

මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, උඩබුලත්ගම, අඹගමුව කෝරලේ අඹගමුවේ පිහිටි මියනගොල්ල ගෙදර වත්ත නමැති ඉඩම සම්බන්ධයෙන් බලයලත් මිනින්දෝරු ඉන්දු තිස්ස කොටඹගේ මහතා විසින් 2007.03.06 දින මැන සාදන ලද අංක 150 දරන පිඹුරේ ප්‍රකාර බෙදා වෙන් කළ රූඩ් දෙකයි පර්චස් විසි තුනයි දශම හතරයි හයක් (අක්කර 0, රූඩ් 02, පර්. 23.46) ක් විශාලකමට මායිම්, උතුරු-නැගෙනහිරට : ඒ. නිමල්සිරි අයිතිවාසිකම් කියන ඉඩමද, දකුණු-නැගෙනහිරට : රේස් පිටියට යන ගම්සභා පාර ද, දකුණු-බස්නාහිරට : ආනන්ද රත්නායක අයිතිවාසිකම් කියන ඉඩම සහ උතුරු-බස්නාහිරට : මහවැලි ගඟද යන මායිම් තුළ පිහිටි ඉඩම සහ ගොඩනැගිලි ඇතුළු සෑම සියළු දේත් ද වේ.

මෙකී දේපල වනාහි ප්‍රසිද්ධ නොතාරිස් මනෝහරී ජයලත් මහත්මියගේ 2007.08.24 දිනැති අංක 6454 ඔප්පුව සහ ප්‍රසිද්ධ නොතාරිස් පී. ප්‍රේමරත්න මහතාගේ 1975.01.20 දිනැති අංක 275 ඔප්පුව ප්‍රකාරව භුක්ති විඳගෙන එනු ලැබේ.

මෙම උකස ගම්පොල ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ බී 12/122 යටතේ 2008.04.10 දින ලියාපදිංචි කර ඇත.

යථෝක්ත මුදල හෝ විකිණීම කරන අවස්ථාව වන විට නොගෙවා ඉතිරිව ඇති කවර හෝ කොටසක් ද, ප්‍රචාරය හා විකිණීම සඳහා දරන්නට සිදුවන වියදම් ද, තීරණයේ දිනට පසුව කරන ලද ගෙවීම් අඩුකර අයකර ගැනීම පිණිස යථෝක්ත පනතේ විධිවිධානවලට අනුව බැංකුවේ ලියාපදිංචි වෙන්දේසිකරු වන ෂොක්මන් සහ සමරවික්‍රම ආයතනය මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට කඳුරට සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරනු ලැබේ.

එච්. එම්. කේ. බී. හෙල්ලරාව,
සාමාන්‍යාධිකාරී.

කඳුරට සංවර්ධන බැංකුව,
ප්‍රධාන කාර්යාලය,
අංක 130, කටුගස්තොට පාර,
මහනුවර.

06-08/1

---

## මහජන බැංකුව - පානදුර ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ ඩී (29D) වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී(29D) වගන්තිය යටතේ මහජන බැංකුවේ අධයක්ෂ මණ්ඩලය විසින් 2008.08.05 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

කළුතර ප්‍රසිද්ධ නොතාරිස් පාලමණ්ඩඩිගේ රෝස් කුමාරි නිශාන්ති ප්‍රනාන්දු විසින් සහතික කරන ලද 2006.09.21 වැනි දිනැති අංක 1390 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම්, 1. මින්දික මෙවන් කඳනආරච්චි මයා, 2. දෙහිගමගේ රේණුක පෙරේරා යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ දැනට රුපියල් නවලක්ෂ හතලිස් අට දහස් පන්සිය හතලිස් දෙකයි ශත පනහ (රු. 9,48,542.50) ක මුදලක් මහජන බැංකුවට අයවීමට ඇති බැවින් ද, 2008.04.07 වැනි දින සිට වර්ෂයකට 17.5% බැගින් රුපියල් නවලක්ෂ හතලිස් අට දහස් පන්සිය හතලිස් දෙකයි ශත පනහ (රු. 9,48,542.50) ක මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය සහ

අදාළ මහජන බැංකු පනතේ 29එල් (29L) වගන්තිය යටතේ අයකර කර ගනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් නවලක්ෂ හතලිස් අට දහස් පන්සිය හතලිස් දෙකයි ශත පනහ (රු. 9,48,542.50) ක මුදල අයකර ගැනීම සඳහා බලයලත් වෙන්දේසිකාර ඊ. සමන්මලී රාමනායක විසින් එකී අංක 1390 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දෙසියකදී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### දේපළ පිළිබඳ විස්තරය

පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ F408/246 දරන පත්ඉරුවේ ලියාපදිංචි වී ඇති බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තල්පිටි දෙබද්දේ, හිරණ ග්‍රාමයේ පිහිටි හික්ගහවත්ත නැගෙනහිර පැත්තේ වෙනස් වූ කට්ටිය, නමැති අංක 2598 දරන පිඹුරේ කැබලි අංක 3/2 ඉඩමට මායිම්, උතුරට : මෙම ඉඩමේ 3/1 දරන කට්ටිය හා ලොට් 2 ද, නැගෙනහිරට : මෙම ඉඩමේ කට්ටියක් ද, දකුණට : අංක 370 ප්‍රකාර 3/3 හා 3/4 කට්ටි ද, බස්නාහිරට : අඩි 10ක් පළල පාරකට වෙන්කළ බිම් හා ලොට් 02 ද යන මායිම් තුළ පිහිටි පර්චස් විසිඑකයි දශම තුනයි අටක් (අ. 0, රූ. 0, පර්. 21.38) ක් විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගහකොළ, පළතුරු, ගොඩනැගිලි ආදී සියලුම දේ ද වේ.

පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ F408/247 දරන පත්ඉරුවේ ලියාපදිංචි වී ඇති ඉහත කී හිරණ ග්‍රාමයේ පිහිටි හික්ගහවත්ත නැගෙනහිර පැත්තේ වෙනස් වූ කට්ටිය නැමැති අංක 2598 දරන පිඹුරේ කැබලි අංක 3/4 (අඩි 11ක පාරක් සඳහා වෙන් කළ බිම් තීරය) දරන ඉඩමට මායිම්, උතුරට : අංක 370 ප්‍රකාර 3/2 ද, නැගෙනහිරට : අංක 370 ප්‍රකාර 3/3 ද, දකුණට : පරණ ගුවල් පාර ද, බස්නාහිරට : අඩි 10ක් පළල පාරකට වෙන්කළ බිම ද, යන මායිම් තුළ පිහිටි පර්චස් හතරයි දශම දෙකයි අටක් (අ. 0, රූ. 0, පර්. 4.28)ක් විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගහකොළ, පළතුරු, ගොඩනැගිලි ආදී සියලුම දේද වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකාර,
කළුතර.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය (කළුතර),
අංක 341, ගාලු පාර,
පානදුර.

06-96

---

### මහජන බැංකුව - මල්වාන ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ ඩී (29D) වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008.09.26 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් එස්. පී. එල්. විජේසිරිවර්ධන විසින් සහතික කරන ලද 2004.07.07 දිනැති අංක 9335 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම්, ඇල්ලප්පෙරුම ආරච්චිලාගේ නිමල් සහ ඇල්ලප්පෙරුම ආරච්චිගේ ධර්මදාස යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ දැනට රුපියල් එක්ලක්ෂ හතලිස් තුන් දහස් පහයි ශත හැට (රු. 1,43,005.60) ක මුදලක් මහජන බැංකුවට දැනට අයවීමට ඇති බැවින් ද, 2008.01.17 දින සිට වර්ෂයකට 15.75% බැගින් රුපියල් එක්ලක්ෂ හතලිස් තුන්දහස් පහයි ශත හැට (රු. 1,43,005.60)ක මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය හා අදාළ මහජන බැංකු පනතේ 29එල් වගන්තිය යටතේ අයකරගනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් එක්ලක්ෂ හතලිස් තුන් දහස් පහයි ශත හැට (රු. 1,43,005.60) ක මුදල අයකර ගැනීම සඳහා කොළඹ බලයලත් වෙන්දේසිකාර රන්ජිත එස්. මහානාම විසින් එකී අංක 9335 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියකදී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### දේපළ පිළිබඳ විස්තරය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරලේ, අධිකාරි පත්තුවේ, බියගම ප්‍රාදේශීය සභා බල සීමාවේ හෙයියන්තුඩුව පිහිටි දෙල්ගහවත්ත, මිල්ලගහවත්ත මීගහවත්ත සහ දෙල්ගහවත්ත නමැති ඉඩමට බලයලත් මානක සී. එච්. ඩී. අබේගුණවර්ධන මහතා විසින් 2004.01.04 වැනි දින මැන සකස් කරන ලද පිඹුරු අංක 2391හි ලොට් සී දරන කොටසට මායිම්, උතුරට : ලොට් අංක බී ද, නැගෙනහිරට : පිඹුරු අංක ටී 130හි ලොට් 2ඒහි ඉතිරි කොටස ද, දකුණට : පිඹුරු අංක 655ඒ හි ලොට් 1/3 ද, බස්නාහිරට : අඩි 15ක් පළල පාර සඳහා වෙන් කළ කොටස ද යන මායිම් තුළ පිහිටි පර්චස් දහය (අ. 0, රූ. 0, පර්. 10) ක් විශාල ඉඩම සහ එහි පිහිටි වැව්ලි, ගොඩනැගිලි ආදී සියලු දේත් වේ.

මෙම ඉඩම ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක සී 679/86 යටතේ ලියාපදිංචි කර ඇත.

ඉහත පිඹුරු අංක 2391හි අඩි 15ක් පළල පාරක් සඳහා වෙන් කර ඇති කොටසේ මාර්ග අයිතියද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ස. ප්‍රාදේශීය කළමනාකාර,
ගම්පහ.

මහජන බැංකුව,
ගම්පහ ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 131, නුවර පාර,
බැලුම්මහර,
මුදුන්ගොඩ.

06-100

---

### මහජන බැංකුව - නුගේගොඩ ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ ඩී (29D) වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී(29D) වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය

විසින් 2009.03.27 වැනි දින පැවැත්වූ එකී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

එකී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී මහජන බැංකුවේ නමට කොළඹ නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් කේ. එස්. ජාගොඩ මහත්මිය විසින් සහතික කරන ලද 2005.04.26 වැනි දිනැති අංක 5622 හා 2007.01.04 දිනැති අංක 6979 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම බස්නායකගේ ඥාණතිලක මයා යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ රුපියල් තුන්ලක්ෂ පනස් පන් දහස් හයසිය හයයි ශත හැට එකක (රු. 3,55,606.61) හා රුපියල් තුන්ලක්ෂ හතලිස් පන් දහසක (රු. 3,45,000) මුදලක් මහජන බැංකුවට අයවීමට ඇති බැවින් ද, 2008.03.29 වැනි දින සිට වර්ෂයකට සියයට පහලොවයි දශම හතයි පහ බැගින් (15.75%) හා 2008.03.01 වැනි දින සිට වර්ෂයකට සියයට විසි දෙක බැගින් (22%) රුපියල් තුන්ලක්ෂ පනස් පන් දහස් හයසිය හයයි ශත හැට එකක් (රු. 3,55,606.61) හා රුපියල් තුන්ලක්ෂ හතලිස් පන් දහසක (රු. 3,45,000) මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය හා අදාළ මහජන බැංකු පනතේ 29 වගන්ති යටතේ අය කරනු ලැබිය යුතු මුදල් හා ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් තුන්ලක්ෂ පනස් පන් දහස් හයසිය හයයි ශත හැට එකක් (රු. 3,55,606.61) හා රුපියල් තුන්ලක්ෂ හතලිස් පන් දහසක් (රු. 3,45,000) අයකර ගැනීම සඳහා කොළඹ බලයලත් වෙන්දේසිකාර එස්. රාමනායක මිය විසින් එකී අංක 5622 හා 6979 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියකදී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### දේපළ පිළිබඳ විස්තරය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළයේ, පල්ලේ පත්තුවේ, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ නගර සභා සීමාව තුළ ඇතුල්කෝට්ටේ වීදිය බණ්ඩාර මාවතේ පිහිටි කෝන්ගහවත්ත නොහොත් බෝගහවත්ත සහ දිගල්පොතේකුඹුර නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. කලුතන්ත්‍රි මහතා විසින් 1996.08.11 වැනි දින මැන සාදන ලද අංක 326 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කළ ලොට් අංක 3 දරන කොටසට මායිම්, උතුරට : ලොට් අංක 2 දරන කැබැල්ල ද, නැගෙනහිරට : අංක 855 දරන පිඹුරේ දැක්වෙන R3 සහ R2 දරන කැබලි ද, දකුණට : අංක 4 දරන කැබැල්ල ද, බස්නාහිරට : කංකානිගේ බෙන්ජමින් පෙරේරාට අයත් කුඹුරු ද යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් හයයි දශම හතරක් (අ. 0, රූ. 0. පර්. 6.4) විශාල ඉඩම සහ එහි තුළ පිහිටි ගහකොළ, පළතුරු, ගොඩනැගිලි ආදී සියලු දේද වේ.

තව ද, පහත සඳහන් මාර්ග අයිතිවාසිකම් ද සමග වේ.

1. ඉහත කී ඇතුල්කෝට්ටේ, වීදිය බණ්ඩාර මාවතේ පිහිටි කෝන්ගහවත්ත නොහොත් බෝගහවත්ත සහ දිගල්පොතේකුඹුර නමැති ඉඩමට අංක 326 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කළ ලොට් අංක 5 දරන අඩි 10ක් පළල පාරක් සඳහා වෙන් කළ පර්චස් බිංදුවයි දශම පහක් (අ. 0, රූ. 0, පර්. 0.5) විශාල බිම් තීරය පොදුවේ පාරක් වශයෙන් පරිහරණය කිරීමේ අයිතිවාසිකම ද වේ.

2. ඉහත කී ඇතුල්කෝට්ටේ, වීදිය බණ්ඩාර මාවතේ පිහිටි කෝන්ගහවත්ත නොහොත් බෝගහවත්ත සහ දිගල්පොතේකුඹුර නමැති ඉඩමට අංක 855 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කළ ලොට් අංක R3 දරන අඩි 10ක් පළල පාරක් සඳහා වෙන් කළ පර්චස් එකයි බිංදුවයි දශම දෙකයි පහක අ. 0, රූ. 0. පර්. 1.25) විශාල බිම් තීරය පොදුවේ පාරක් වශයෙන් පරිහරණය කිරීමේ අයිතිවාසිකම ද වේ.

3. ඉහත කී ඇතුල්කෝට්ටේ, වීදිය බණ්ඩාර මාවතේ පිහිටි "කෝන්ගහවත්ත නොහොත් බෝගහවත්ත සහ දිගල්පොතේකුඹුර" නමැති ඉඩමට අංක 855 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කළ ලොට් අංක R2 දරන අඩි 30ක් පළල පාරක් සඳහා වෙන් කළ රූඩ් එකයි පර්චස් දහයයි දශම පහක් (අ. 0, රූ. 1, පර්. 10.5) විශාල බිම් තීරය පොදුවේ පාරක් වශයෙන් පරිහරණය කිරීමේ අයිතිවාසිකම ද වේ.

මෙම උකස්කරය ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක M 3024/60 යටතේ ලියාපදිංචි වී ඇත.

මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සහකාර සාමාන්‍යාධිකාරී,
බටහිර කළාප II

ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
කොළඹ පිටත, මහජන බැංකුව,
අංක 102, ස්ටැන්ලි තිලකරත්න මාවත,
නුගේගොඩ.

06-98

---

### ලංකා බැංකුව

### 1968 අංක 34 දරන නීතියෙන් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධිත ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වගන්තිය යටතේ දැන්වීම

2009.05.05 වැනි දින පවත්වන ලද රැස්වීමකදී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. ප්‍රසිද්ධ නොතාරිස් ඒ. එම්. ගංගනාථ මහතා විසින් සහතික කරන ලද 2008.03.17 වැනි දිනැති අංක 10890 දරන උකස්කරය මත මුල් මුදල් හා 2009.01.13 වැනි දින තෙක් පොලිය වශයෙන් රුපියල් දසලක්ෂ පහලොස් දහස් තුන්සිය අසූපහයි ශත පනහක (රු. 10,15,385.50) මුදල සමග රුපියල් නවලක්ෂ විසිහය දහස් හාරසිය පහයි ශත නවයක (රු. 9,26,405.09) මුදල මත 2009.01.14 වැනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් සියයට විසිතුනක (23%) වාර්ෂික පොළියක් ද, මහනුවර, පේරාදෙණිය පාර, අංක 87ඒ දරන ස්ථානයේ පදිංචි කුමුදු ජගත් රාජරත්න මයා, නිකුල්ගහ මුදුනේ ගෙදර කරුණාතිලක මයා හා චමිලා තුෂාරි නිරංජලා කරුණාතිලක මිය යන අයවළුන්ගෙන් ලංකා බැංකුවට එක්ව හා වෙන් වෙන්ව අයවිය යුතුව ඇත.

2. ඉහත කී ප්‍රසිද්ධ නොතාරිස් ඒ. එම්. ගංගනාථ මහතා විසින් සහතික කරන ලද 2008.03.17 වැනි දිනැති අංක 10890 දරන උකස්කරය මත අයවිය යුතු රුපියල් දසලක්ෂ පහලොස් දහස් තුන්සිය අසූ පහයි ශත පනහක (රු. 10,15,385.50) මුදල සමග 2009.01.14 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොළිය ද ලංකා බැංකු ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ අයකරගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස්කර ඇති මෙහි පහත උපලේඛනයේ විස්තර කරන ලද දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට, මහනුවර, ටොරිංටන් පාර, අංක 24හි පදිංචි වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන්ට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 19 වැනි වගන්තිය හා එහි සංශෝධනයන් යටතේ ද මෙම යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම, මහනුවර ලංකා

බැංකු අධිශ්‍රේණි ශාඛාවේ, කළමනාකරු විසින් ප්‍රසිද්ධ කිරීමට එකී ලංකා බැංකු ආඥාපනතේ 21 වැනි වගන්තිය යටතේ ද මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

**උපලේඛනය**

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, යටිනුවර ගඟ පළාත කෝරළේ, කිරිබත්කුඹුර හි පිහිටි බලයලත් මිනින්දෝරු ඒ. බී. කිරින්ද මයා විසින් සාදන ලද 1992.05.07 වැනි දිනැති අංක 3919 දරන පිඹුරේ කැබලි 1 යනුවෙන් පෙන්නුම් කර ඇති "අම්බලන්දෙනිය ගුරුන්නැහෙලාගේ වත්ත හෙවත් ජෙස්මින් වත්ත" යැයි හඳුන්වනු ලබන ඉඩමේ කොටසක් වන, ඊශානදෙසට : එකී පිඹුරේ කැබලි 5 ද, ගිණිකොණ දෙසට : එකී පිඹුරේ අංක 2 දරන කැබැල්ල ද, නිරිත දෙසට : ප්‍රධාන පාර හා ග්‍රාමයේ සිට ප්‍රධාන පාරට එන පාර ද, වයඹ දෙසට : අංක 3322 දරන පිඹුරේ කැබලි 24 හා 27 යනුවෙන් පෙන්නුම් කර ඇති ඉඩමේ ඉතිරි කොටස ද මායිම්වූ පර්චස් දොළහක (අ. 0, රූ. 0, පර්. 12) ප්‍රමාණයෙන් යුත්, බෙදා වෙන් කරන ලද ඉඩම් කට්ටියය සියල්ල හා එහි තුළ ඇති සෑම සියළු දේත් වේ.

මෙය මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 412/123හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඊ. එම්. උපතිස්ස බණ්ඩාර මයා,
ප්‍රධාන කළමනාකරු.

ලංකා බැංකුව,
අධිශ්‍රේණි ශාඛාව,
මහනුවර.

06-108

---

**මහජන බැංකුව - ජා ඇල ශාඛාව**

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.03.27 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් එස්. පී. එල්. විජේසිරිවර්ධන විසින් සහතික කරන ලද 2007.09.17 දිනැති අංක 12783 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම්. තුප්පහි රාලලාගේ ඇන්ටන් පාලිත දසා යන අය විසින් පැහැර ඇති බැවින්ද, එකී උකස්කරය යටතේ දැනට රුපියල් පනස් අට ලක්ෂ තිස් එක් දහස් හාරසිය හතලිස් අටයි ශත දහතුන (රු. 58,31,448.13) ක මුදලක් මහජන බැංකුවට දැනට අය වීමට ඇති බැවින් ද, 2008.07.18 දින සිට වර්ෂයකට 22% බැගින් රුපියල් පනස් අට ලක්ෂ තිස් එක් දහස් හාරසිය හතලිස් අටයි ශත දහතුන (රු. 58,31,448.13)ක මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය හා අදාල මහජන බැංකු පනතේ 29එල් වගන්තිය යටතේ අයකරනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් පනස් අට ලක්ෂ තිස් එක් දහස් හාරසිය හතලිස් අටයි ශත දහතුන (රු. 58,31,448.13)ක මුදල අයකර ගැනීම සඳහා කොළඹ බලයලත් වෙන්දේසිකාර ශොක්මන් සහ සමරවික්‍රම විසින් එකී අංක 12783 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපල හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියකදී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

**උකස්කර ඇති දේපල පිළිබඳ විස්තර**

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ, ජා-ඇල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ, දඩුගම උපකාර්යාල සීමාවේ, ඒකල, කුරුඳුවත්ත පිහිටි, ජොසිටාවත්ත නැමැති ඉඩමට බලය පත් මානක එම්. ඩී. එඩ්වඩ් මහතා විසින් 2006.05.09 වනදින මැන සකස් කළ අංක 4034ඩී දරන පිඹුරේ ලොට් අංක 14 දරන කොටසට මායිම් - උතුරට : ලොට් 15ද, නැගෙනහිරට : මෙම ඉඩමේ ඉතිරි කොටස ද, දකුණට: ලොට් අංක 12ඒ ද, බස්නාහිරට : ලොට් 22(පාර සඳහා වෙන් කළ කොටස) ද යන මායිම් තුළ පිහිටි පර්චස් දහය (රු. 0, රූ.0, පර්. 10) ක් විශාල ඉඩම සහ එහි පිහිටි වැව්ලි ගොඩනැගිලි ආදී සියළු දේත් වේ.

මෙම ඉඩම මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක බී 203/244 යටතේ ලියාපදිංචි කර ඇත.

ඉහත කී පිඹුරේ පාරවල් සඳහා වෙන් කර ඇති කොටස් වල මාර්ග අයිතියද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකාර,
ගම්පහ.

මහජන බැංකුව,
ගම්පහ ප්‍රාදේශීය කාර්යාලය,
131, නුවර පාර,
බැලුම්මහර,
මුදුන්ගොඩ.

06-93

---

**මහජන බැංකුව - ඕල්කොට් මාවත**

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී (29D) වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008.10.24 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ:

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් අයි. ඩී. එච්. එල්. පෙරේරා මහත්මිය විසින් සහතික කරන ලද 2005.03.01 දිනැති අංක 472 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම්. සුදේශ් වික්‍රමසිංහ සේනානායක මයා යන අය විසින් පැහැර ඇති බැවින්ද, එකී අංක 472 දරන උකස්කරය යටතේ දැනට රුපියල් හත්ලක්ෂ තිස්හයදහස් නවසියයක (රු. 736,900.00) මුදලක් බැංකුවට අයවීමට ඇති බැවින්, එම මුදල සහ එකී හත්ලක්ෂ තිස්හයදහස් නවසියයක (රු. 736,900.00) මුදල සඳහා2007.12.01 දින සිට වර්ෂයකට 18.25% බැගින් වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය සහ අදාල මහජන බැංකු පනතේ 29එල් (29L)වගන්තිය යටතේ අයකර ගනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම්

ඒවා අඩුව එකී මුදල් අයකර ගැනීම සඳහා කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් අයි. ඩී. එච්. එල්. පෙරේරා මහත්මිය විසින් 2005.03.01 දින සහතික කල අංක 472 දරන උකස්කරය යටතේ බැංකුවට උකස්කර ඇති දේපළ හා පරිශ්‍රයන් කොළඹ බලයලත් වෙන්දේසිකාර ඊ. එස්. රාමනායක මහත්මිය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියකදී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂක මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### උකස්කර ඇති දේපල පිළිබඳ විස්තර

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, කලපලුවාව ගම පිහිටි මිල්ලගහවත්ත හෙවත් මිල්ලගහහේන නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. ඒ. කපුගීකියන මහතා විසින් මැන සකස් කරන ලද පිඹුරු අංක 2044 සහ 1993.04.03 දිනැති පිඹුරේ ලොට් 8සී1ට මායිම්, උතුරට : පාරද. නැගෙනහිරට : ලොට් 8සී 2 ද, දකුණට : හෙන්රි පෙරේරාට අයත් ඉඩමද, බස්නාහිරට : එච්. එම්. ආරියදාසට අයත් ඉඩම ද (වඩාත් නිවැරදිව ලොට් 8ඒ (පිඹුරු අංක 879හි) සහ ලොට් 8බී පිඹුරු අංක 2042 යන මායිම් තුළ පිහිටි පර්චස් පහළොවක් (අ.0, රූ.0, පර්. 15.0) ක් විශාල ඉඩම සහ එහි පිහිටි වැවිලි ගොඩනැගිලි ආදී සියලු දේ ද වේ.

මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී. 1121/181 හි ලියාපදිංචි වී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකාර,
කොළඹ - උතුර.

කලාපීය ප්‍රධාන කාර්යාලය.
(බටහිර කළාපය - 01)
අංක 11, ආදිපාදවීදිය,
කොළඹ 01.

06-91

---

### මහජන බැංකුව - කටුනායක

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඞී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඞී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008.09.26 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ :

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් වී. ඒ. ද සිල්වා විසින් සහතික කරන ලද 2006.04.26 දිනැති අංක 3224 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම්. කෝරළගමගේ ප්‍රැන්සිස් ලාල් ජානක පෙරේරා යන අය විසින් පැහැර ඇති බැවින්ද, එකී උකස්කරය යටතේ දැනට රුපියල් දෙලක්ෂ හතලිස් එක් දහස් තුන්සිය හැටයි ශත හතලිස් නවය(රු. 241,360.49) ක මුදලක් මහජන බැංකුවට දැනට අය වීමට ඇති බැවින්ද, 2008.03.28 දින සිට වර්ෂයකට 20.5% බැගින් රුපියල් දෙලක්ෂ හතලිස් එක්දහස් තුන්සිය හැටයි ශත හතලිස් නවය (රු. 241,360.49)ක මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය හා අදාල මහජන බැංකු පනතේ 29එල් වගන්තිය යටතේ අයකරනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් දෙලක්ෂ හතලිස් එක් දහස් තුන්සිය හැටයි ශත හතලිස් නවය (රු. 241,360.49)ක මුදල අයකර ගැනීම සඳහා කොළඹ බලයලත් වෙන්දේසිකාර ඊ. එස්. රාමනායක විසින් එකී අංක 3224 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපල හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියකදී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### උකස්කර ඇති දේපල පිළිබඳ විස්තර

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරළේ, දුනගහ පත්තුවේ, කටාන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ, දඬුගම උපකාර්යාල සීමාවේ, කොන්දගම් මුල්ල ගමේ පිහිටි නුගගහ වත්ත හෙවත් කැකුන ගහවත්ත නැමැති ඉඩමට බලය පත් මානක එම්. ගුණසේකර මහතා විසින් 1997.06.16 වනදින මැන සකස් කළ අංක 932 දරන පිඹුර ප්‍රකාර මායිම් උතුරට : ජී. වාල්ස්ස් ප්‍රනාන්දුට අයත් ලොට් සී දරණ කොටස ද, නැගෙනහිරට : වීදි මාවත ද (පී. එස්), දකුණට : මාර්තාහාමිට අයත් ඊ දරන කොටසද, බස්නාහිරට : ජෝශප් සිල්වාට අයත් ඉඩමද යන මායිම් තුල පිහිටි රූඩ් එකයි පර්චස් එකයි දශම දෙකයි පහ(අ.0, රූ.1, පර්.1.25) ක් විශාල ඉඩම සහ එහි පිහිටි වැවිලි ගොඩනැගිලි ආදී සියළු දේත් වේ.

මෙම ඉඩම මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක ඊ 896/117 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකාර,
ගම්පහ.

මහජන බැංකුව,
ගම්පහ ප්‍රාදේශීය කාර්යාලය,
131, නුවර පාර,
බැලුම්මහර,
මුදුන්ගොඩ.

06-92

---

### මහජන බැංකුව - ගාල්ල - කොටුව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංක- පනතේ 29ඞී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඞී (29D)වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.01.30 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් එම්. ජී. සී. අරෝෂනී විසින් 2006.02.01 දින ලියා සහතික කරන ලද අංක 939 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම්, සුදුවගේ නිලන්ත මෙවන් යන අය විසින් පැහැර හැර ඇති බැවින්ද, එකී උකස්කරය යටතේ දැනට රුපියල් දෙලක්ෂ අසූඑක්දහස් තුන්සිය අනුහයයි ශත තිස්තුන (281,396.33) ක මුදලක් මහජන බැංකුවට අයවීමට ඇති බැවින්ද, 2008.02.15 දින සිට වර්ෂයකට සියයට විස්සයි දශම

හතයි පහ (20.75%) බැගින් රුපියල් දෙලක්ෂ අසූඑක්දහස් තුන්සිය අනූහයයි ශත තිස්තුන (281,396.33) මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය හා අදාල මහජන බැංකු පනතේ 29එල් (29L) වගන්තිය යටතේ අයකර ගනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් දෙලක්ෂ අසූඑක්දහස් තුන්සිය අනූහයයි ශත තිස්තුන (281,396.33) ක මුදල අයකර ගැනීම සඳහා බලයලත් වෙන්දේසිකාර ජී. පී. ආනන්ද විසින් එකී අංක 939 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස් කර ඇති දේපල හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියකදී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### උකස්කර ඇති දේපල පිළිබඳ විස්තර

දකුණු පළාතේ, ගාලු දිස්ත්‍රික්කයේ, තල්පෙ පත්තුවේ, කලහේ පිහිටි ඉලුක්කැටිය කැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. ජී. වීරසූරිය විසින් 2005.08.12 දින මැන සාදන ලද අංක 1431 දරන පිඹුර පරිදි 1 බෙදූ අංක 1ඒ දරන කැබැල්ලට මායිම් : උතුරට : සපුගහවත්ත ද, නැගෙනහිරට : සහ දකුණට : පිඹුරු අංක 684 සඳහන් ලොට් අංක 1 හි ඉතිරි කොටස ද, බස්නාහිරට : මහාමාර්ගය සිට මීගොඩ දක්වා පාර ද යන මෙකී සතර මායිම් තුල පිහිටි පර්චස් දාහතරයි දශම එකයි පහ (අක්.0, රූඩ්.0 පර්චස් 14.15) ක් විශාල ඉඩම සහ එහි පිහිටි වැව්ලි ගොඩනැගිලි ඇතුලු සියලුම දේ ද වේ.

මෙම ඉඩම ගාල්ල ඉඩම් දිස්ත්‍රික් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක D902/195 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකාර,
ගාල්ල.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
නො. 22, පහල ඩික්සන් පාර,
ගාල්ල.

06-95

---

### මහජන බැංකුව - පානදුර ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඇ වගන්තිය යටතේ යෝජනා සම්මතය

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඇ වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008.06.27 වන දින පැවැත් වූ එකී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී පහත දැක්වෙන යෝජනාව ඒකමතිකව සම්මත කර ගත් බව මෙයින් නිවේදනය කරනු ලැබේ:

මහජන බැංකවේ නමට කළුතර ප්‍රසිද්ධ නොතාරිස් ජී. ආර්. කේ. එන්. ප්‍රනාන්දු මහතා විසින් සහතික කරන ලද අංක 813 සහ 2004.09.15 වන දින දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු ගෙවීම් කිරීම, මද්දුම ආරච්චිලාගේ සුනිල් කුමාරසිරි පෙරේරා සහ සජීවි මල්ලිකා ජයසිංහ යන දෙදෙනා විසින් පැහැර හැර ඇති හෙයින්, දැන් එකී අංක 813 දරන බැඳුම්කරය මත රුපියල් අට ලක්ෂ පනස් එක් දහස් පන්සිය හතලිස් හතයි ශත හැත්තෑ තුන (රු. 8,51,547/73) ක මුදලක් මහජන බැංකුවට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇත. එබැවින්, 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතින් පැවරී ඇති බලතල යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, රුපියල් අට ලක්ෂ පනස් එක දහස් පන්සිය හතලිස් හතයි ශත හැත්තෑ තුන (රු. 8,51,547/73) ක එකී මුදල ද, 2007.09.29 දින සිට විකිණීමේ දිනය තෙක් රුපියල් අට ලක්ෂ පනස් එක් දහස් පන්සිය හතලිස් හතයි ශත හැත්තෑ තුන (රු. 8,51,547/73) මුදලක් මත වර්ෂයකට සියයට පහළොවයි දශම හතයි පහ (15.75%) බැගින් පොළිය ද, එකී මහජන බැංකු පනතේ 29 ඕ වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් ද, විකිණීමේ ගාස්තු ද එදින තෙක් කරනු ලැබ ඇති ගෙවීම් (කිසිවක් වේ නම්) අඩු කිරීමෙන් පසු අයකර ගැනීම සඳහා අංක 813 දරන උකස් බැඳුම්කරය මගින්, එකී බැංකුවට උකස් කර ඇති දේපළ සහ පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකරු සමන්මලී රාමනායක මහත්මිය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බව මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### දේපල සහ පරිශ්‍ර පිළිබඳ විස්තර

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ කළුතර ප්‍රාදේශීය සභා සීමාව තුළ මැලේගම පිහිටියාවූද, කැකුණවත්ත තුඩුව යයි කියනු ලබන දැන් අරලිය ගාර්ඩන් යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමේ බලයලත් මිනින්දෝරු වයි කරුණාරත්න කොස්තා විසින් සාදන ලද අංක 912 සහ 1989 පෙබරවාරි 02 හා 03 දින දරන පිඹුරේ, ලොට් අංක 50 ලෙස ලකුණුකොට නිරූපණය කර ඇත්තාවූ ද, ඊසාන දෙසට : ලොට් අංක 39 ද, ගිණිකොණ දෙසට : ලොට් අංක 51 ද, නිරිත දෙසට : (අඩි 20 ක් පාර සඳහා වෙන් කිරීම වන) ලොට් R3 ද, වයඹ දෙසට : ලොට් අංක 49 ද, මායිම් වන්නාවූ ද, එකී අංක 912 දරන පිඹුරට අනුව, පර්චස් විස්සක් (අ.00, රූ.00, පර්.20) විශාල වූ ද, පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ G75/236 යටතේ ලියාපදිංචි කර ඇත්තාවූද, බෙදා වෙන් කරන ලද මුළු ඉඩමේ කොටස සහ එහි පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වැව්ලි සහ වෙනත් සියළුදේත් ය.

පහත විස්තර කරනු ලබන පාර සඳහා වෙන් කිරීම උඩින් සහ දිගේ මාර්ග ප්‍රවේශ අයිතිය ද මීට ඇතුළත් වේ :-

1. ඊසාන දෙසට ලොට් අංක 1,2,3 සහ (අඩි 20 ක් පළල පාර සඳහා වෙන් කරන ලද) R1 සහ ලොට් 6,20,21,22,23,24,25,26,27,28,29 හා 30 ද, ගිණිකොණ දෙසට: (අඩි 20 ක් පළල පාර සඳහා වෙන් කළ) R1ද, නිරිත දෙසට: ලොට් අංක 41,40,39,38,37,36,35,34,33,32,57,56,55,54 සහ (අඩි 20 ක් පළල පාර) R3 හා ලොට් අංක 31 ද, වයඹ දෙසට අරලිය මාවත ද මායිම් වන්නාවූ ද එකී අංක 912 දරන පිඹුරට අනුව, රූඩ් දෙකයි පර්චස් විසි එකයි දශම හයක් (අ.00, රූ.2, පර්.21.6) විශාල වූ ද, පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ G159/190 යටතේ ලියාපදිංචි කර ඇත්තාවූ ද ඉහත කී R2 ලෙස ලකුණු කරන ලද බෙදා වෙන් කරන ලද මුළු ඉඩම් කොටස.

2. ඊසාන දෙසට: (අඩි 20 ක් පළල පාර වන) R2 සහ (අඩි 20 ක් පළල පාර වන) ලොට් R1 සහ ලොට් 31,42,44,45,46,47,48,49,50,51 හා 53 ද, ගිණිකොණ දෙසට: බලයලත් මිනින්දෝරු වයි. කරුණාරත්න කොස්තා විසින් සාදන ලද අංක 868 හා 1988.09.23 දින දරන පිඹුරේ දැක්වෙන ඉඩම සහ ලොට් 71 ද, නිරිත දෙසට ලොට් 70,69,68,67,66,65,64,63,62,61,60,59 හා 58 ද, බස්නාහිරට: ලොට් අංක 53, 52 හා 41 ද, මායිම් වන්නාවූ ද එකී අංක 912 දරන පිඹුරට අනුව රූඩ් දෙකයි පර්චස් එකයි දශම හතරක් (අ.00, රූ.2, පර්.1.4) විශාල වූ ද පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ

G114/17 යටතේ ලියාපදිංචි කර ඇත්තාවූ ද බෙදා වෙන් කරන ලද මුළු ඉඩම් කොටස

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකරු,
කළුතර.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය (කළුතර),
කළුතර.

06-97

---

**මහජන බැංකුව - ජාඇල ශාඛාව**

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.01.30 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ:

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් එස්. පී. එල්. විජේසිරිවර්ධන විසින් සහතික කරන ලද 2007.07.27 දිනැති අංක 12676 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම්, පතිරගේ සංජය ඉඳුනිල් යන අය විසින් පැහැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ දැනට රුපියල් පනස් හතර ලක්ෂ පන් දහස් හත්සිය පනස් නවයයි ශත තිස් හය (රු .54,05,759.36) ක මුදලක් මහජන බැංකුවට දැනට අයවීමට ඇති බැවින් ද, 2008.07.30 දින සිට වර්ෂයකට 22% බැගින් රුපියල් පනස් හතර ලක්ෂ පන් දහස් හත්සිය පනස් නවයයි ශත තිස් හය (රු.54,05,759.36) ක මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය හා අදාල මහජන බැංකු පනතේ 29එල් වගන්තිය යටතේ අයකරනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් පනස් හතර ලක්ෂ පන් දහස් හත්සිය පනස් නවයයි ශත තිස් හය (රු.54,05,759.36) ක මුදල අයකර ගැනීම සඳහා කොළඹ බලයලත් වෙන්දේසිකාර ඊ. එස්. රාමනායක විසින් එකී අංක 12676 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස් කර ඇති දේපල හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියක දී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

**දේපල පිළිබඳ විස්තර**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අධිකාරි පත්තුවේ, බියගම ප්‍රාදේශීය සභා බල සීමාවේ පහළ බියන්විල පිහිටි, මිල්ලගහවත්ත හෙවත් මකුල්ලගහකුඹුර සහ මකුල්ලගහවත්ත නැමැති ඉඩමට බලය ලත් මානක එම්. ඩී. එඩ්වඩ් මහතා විසින් 2005.06.17 වන දින මැන සකස් කරන ලද පිඹුරු අංක 3688 සී හි ලොට් 3 දරන කොටසට මායිම් : උතුරට : ලොට් 2 ද, නැගෙනහිරට : ආනන්ද වීරසේකරට අයත් ඉඩම ද, දකුණට : ලොට් 4 ද, බස්නාහිරට : ලොට් 12 (අඩි 15 ක් පළල මාර්ගය සඳහා වෙන්කළ කොටස) ද යන මායිම් තුල පිහිටි පර්චස් හය (අක්කර 0, රූඩ් 0, පර්චස් 06) හෙවත් හෙක්ටයාර 0.01518 ක් විශාල ඉඩම සහ එහි පිහිටි වැව්ලි ගොඩනැගිලි ආදී සියළු දේත් වේ.

මෙම ඉඩම ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක සී 832/33 යටතේ ලියාපදිංචි කර ඇත.

මෙම ඉඩමේ පාරවල් සඳහා වෙන් කර ඇති කොටසේ මාර්ග අයිතියද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකාර,
ගම්පහ.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 131, නුවර පාර,
බැලුම්මහර,
මුදුන්ගොඩ.

06-99

---

**මහජන බැංකුව - ලිබර්ටි ප්ලාසා ශාඛාව**

**1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ යෝජනාව**

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2004.03.31 වැනි දින පැවැත්වූ එකී අධ්‍යක්ෂ මණ්ඩලය පහත සඳහන් යෝජනා සම්මතය ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ:

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්. ඒ. ආර්. එස්. අබේරත්න මහත්මිය මහජන බැංකුව වෙනුවෙන් සහතික කරන ලද, පිළිවෙලින් 2002.10.17 දිනැති අංක 982 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම් කිරීම ප්‍රින්සි ද සිල්වා මදනායක යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී 982 දරන උකස්කර යටතේ රුපියල් නවලක්ෂ හතලිස් දෙදහස් හාරසිය හතලිස් තුනයි ශත හතලිස් හතක් පමණක් (රු. 942,443.47) මුදලක් දැනට මහජන බැංකුවට ගෙවීමට ඉතිරිව ඇති බැවින් ද, 2003.07.07 වැනි දින සිට වර්ෂයකට 21.5% බැගින් රුපියල් නවලක්ෂ හතලිස් දෙදහස් හාරසිය හතලිස් තුනයි ශත හතලිස් හතක් පමණක් (රු.942,443.47) වෙනුවෙන්, වෙන්දේසි දිනය තෙක් පොලිය හා වෙන්දේසි ගාස්තු ද, සමග ඒ අතරතුර කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම්, ඒවා අඩුව රුපියල් නවලක්ෂ හතලිස් දෙදහස් හාරසිය හතලිස් තුනයි ශත හතලිස් හතක් පමණක් (රු.942,443.47) මුදල අයකර ගැනීම සඳහා කොළඹ බලයලත් වෙන්දේසිකරු ඊ. එස්. රාමනායක මහත්මිය විසින් එකී 982 උකස්කර යටතේ එකී බැංකුවට උකස් කර ඇති දේපළ හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පණත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කරයි.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, කැස්බෑව ප්‍රාදේශීය සභා සීමාව තුළ මකුළුදූව සහ දූලම්මහර යන ගම් දෙකට අයිතිව පිහිටි දවටගහවත්ත සහ ඉඳිගහකනත්ත නමැති

දැනට මකුළුඳූව එස්ටේට් යැයි කියනු ලබන ඉඩමට බලයලත් මිනින්දෝරු පී. ඩී. පී. වීරසිංහ මහතා විසින් වර්ෂ 1992.11.12 වැනි දින මැන සකස් කරන ලද අංක 2044 දරන පිඹුර ප්‍රකාරව කැබලි අංක 4ඒ2 දරන කොටසට මායිම් උතුරට : පාරට වෙන් කරන ලද කැබලි අංක 4 එප් ද, (වඩා නිවැරදි ලෙස කැබලි අංක 4 ඊ) නැගෙනහිරට : කැබලි අංක 4ඒ1ද, දකුණට : ටී. එම්. ජිනදාසට අයිති ඉඩම ද, බස්නාහිරට : කැබලි අංක 4ඒ3 ද, යන මෙකී මායිම් තුල පිහිටි පර්චස් පහලොවක් (අක්කර 0, රූඩ් 0, පර්චස් 15) ක් විශාල ඉඩම සහ ඒ තුල පිහිටි ගහකොළ, පළතුරු, ගොඩනැගිලි ආදී සියළු දේද වේ.

ඉහත සඳහන් ඉඩම සඳහා පහත සඳහන් මාර්ග අයිතිය හා අනෙකුත් සියළු පොදු පහසුකම් ද වේ.

එම ඉඩමට යාමට ඊමට ඇති අංක 150 පිඹුරේ කැබලි අංක 4ඒ දරන ඇම් 1417/12 හි ලියාපදිංචි කර ඇති පාරක් සඳහා වෙන් කරන ලද බිමද, ඒ. ඩී. රූබසිංහ මිනින්දෝරු තැනගේ අංක 1002 සහ 1974.10.07 පිඹුරු ප්‍රකාරව කැබලි අංක 16 දරන ඇම්. 815/295 හි ලියාපදිංචි බිම් තීරයේ ද මාර්ග අයිතිය සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සහකාර සාමාන්‍යාධිකාරි,
(බටහිර කලාපය් 01)

මහජන බැංකුව,
කලාපීය ප්‍රධාන කාර්යාලය,
බටහිර කළාප 01,
අංක 11, ආදිපාද වීදිය,
කොළඹ 01.

06-94

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන

## සංශෝධිත ගාස්තු

2009 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2009 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. ශ. |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 00 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 00 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... ... | 1,300 00 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... ... | 2,600 00 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ ගැසට් පත්‍රයේ සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. **2009 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

*** ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)**

| | *වාර්ෂික දායක මුදල* රු. ශ. | *තැපැල් ගාස්තුව* රු. ශ. |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය … … … … … … | 2,080 00 | 3,120 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) … … | 1,300 00 | 3,120 00 |
| III වැනි ඡේදය … … … … … … | 780 00 | 3,120 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) … … | 4,160 00 | 6,240 00 |
| II වැනි කොටස … … … … … … | 580 00 | 3,120 00 |
| III වැනි කොටස … … … … … … | 405 00 | 3,120 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) … … … | 890 00 | 2,400 00 |
| V වැනි කොටස … … … … … … | 860 00 | 420 00 |
| VI වැනි කොටස … … … … … … | 260 00 | 180 00 |
| අති විශෙෂ ගැසට් පත්‍රය … … … … … … | 5,145 00 | 5,520 00 |

*(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය.)*

*** තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)**

| | *පිටපතක මිළ* රු. ශ. | *තැපැල් ගාස්තුව* රු. ශ. |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය … … … … … … | 40 00 | 60 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) … … | 25 00 | 60 00 |
| III වැනි ඡේදය … … … … … … | 15 00 | 60 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) … … | 80 00 | 120 00 |
| II වැනි කොටස … … … … … … | 12 00 | 60 00 |
| III වැනි කොටස … … … … … … | 12 00 | 60 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) … … … | 23 00 | 60 00 |
| V වැනි කොටස … … … … … … | 123 00 | 60 00 |
| VI වැනි කොටස … … … … … … | 87 00 | 60 00 |

* කොළඹ 05, කිරුළපන, මායා මාවතේ, අංක 132 හි ප්‍රකාශන කාර්යංශයේ තනිපිටපත් විකිණීම සහ දායක මුදල් භාර ගැනීමේ අධිකාරී වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙනන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවාත් හැර එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා රජයේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියලු ම දායක මුදල් කොළඹ 05, කිරුළපන, මායා මාවතේ අංක 132 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත නොව රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2009** | | | |
| ජුනි | 2009.06.05 | සිකුරාදා | 2009.05.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2009.06.12 | සිකුරාදා | 2009.05.29 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2009.06.19 | සිකුරාදා | 2009.06.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2009.06.26 | සිකුරාදා | 2009.06.12 | සිකුරාදා | දහවල් | 12.00 |
| ජූලි | 2009.07.03 | සිකුරාදා | 2008.06.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2009.07.10 | සිකුරාදා | 2008.06.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2009.07.17 | සිකුරාදා | 2009.07.03 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2009.07.24 | සිකුරාදා | 2009.07.10 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2009.07.31 | සිකුරාදා | 2009.07.17 | සිකුරාදා | දහවල් | 12.00 |
| අගෝස්තු | 2009.08.07 | සිකුරාදා | 2009.07.24 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2009.08.14 | සිකුරාදා | 2009.07.31 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2009.08.21 | සිකුරාදා | 2009.08.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2009.08.28 | සිකුරාදා | 2009.08.14 | සිකුරාදා | දහවල් | 12.00 |

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2009 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.